# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1978 සැප්තැම්බර් මස 6 වන දින]

2007 අංක 36 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතෙන් අවසන් වරට කරන ලද සංශෝධනය දක්වා සංශෝධන ඇතුළත් කර ඇත

පොදු පරිශීලනය සඳහා පමණී - ගාමිණී ගුණසේකර

පතු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ද ෆොන්සේකා

# 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

## පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 1. | ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය | 1 |
| | **I වන කොටස** | |
| | **නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය** | |
| 2. | නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ සභාපතිවරයා පත් කිරීම | 1 |
| 3. | අමාත්‍යවරයාගේ නියමයකින් ප්‍රදේශ සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම සහ එවැනි නියමයක බලපෑම | 1 |
| 4. | අධිකාරියේ කළමනාකාර මණ්ඩලයේ සංයුතිය | 2 |
| 5. | කාරක සභා පිහිටුවීමට මණ්ඩලයට ඇති බලය | 5 |
| 6. | අධිකාරියේ මුද්‍රාව | 5 |
| 7. | උපදේශක කාරක සභා පිහිටුවීම | 5 |
| | **II වන කොටස** | |
| | **බලතල හා කටයුතු** | |
| 8. | අධිකාරියේ බලතල හා කටයුතු | 6 |
| | **IIඅ වන කොටස** | |
| | **සැලසුම් කිරීමේ කාර්ය පටිපාටිය** | |
| 8අ. | සංවර්ධන සැලසුම් යනාදිය පිළියෙළ කිරීම | 8 |
| 8ආ. | සැලසුම් කිරීමේ කමිටු පත් කිරීම | 8 |
| 8ඇ. | සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු යනාදිය ඉල්ලා සිටීමට අධිකාරියට ඇති බලය | 8 |
| 8ඈ. | කෙටුම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම | 8 |
| 8ඉ. | කෙටුම්පත් සංවර්ධන සැලැස්ම සැලසුම් කිරීමේ කමිටු විසින් පරීක්ෂා කොට අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු බව | 9 |
| 8ඊ. | සංවර්ධන සැලැස්ම අනුමත කිරීම | 9 |
| 8උ. | සංවර්ධන සැලැස්ම අනුමත කිරීම යනාදිය පිළිබඳ දැන්වීම | 9 |
| 8ඌ. | සංවර්ධන සැලැස්ම සංශෝධනය කිරීම යනාදිය | 9 |
| 8එ. | සංවර්ධන ප්‍රදේශවල සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරත වීම සඳහා අවසර පත්‍ර | 10 |
| 8ඒ. | සංවර්ධන කටයුතු අවසර පත්‍රය යනාදියට අනුකූල විය යුතු බව | 11 |
| 8ඔ. | වරිපනම් අඩු කිරීම | 11 |

# 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

## පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| | **III වන කොටස** | |
| | **මුදල්** | |
| 9. | අධිකාරියේ අරමුදල් | 12 |
| 10. | 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම | 12 |
| 11. | මණ්ඩලයේ ණයට ගැනීම් පිළිබඳ බලතල | 13 |
| 12. | ආණ්ඩුවේ ඇපවීම | 13 |
| | **IV වන කොටස** | |
| | **කාර්ය මණ්ඩලය** | |
| 13. | අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා | 14 |
| 14. | නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම | 14 |
| | **V වන කොටස** | |
| | **නිශ්චල දේපළ අත්කර ගැනීම සහ අධිකාරියට අයත් ඉඩම් විකිණීම** | |
| 15. | යම් පළාත් පාලන ආයතනයක බල සීමාව තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් වූ බලය | 15 |
| 16. | ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා දේපළ අනිවාර්යයෙන් අත් කර ගැනීම | 16 |
| 17. | රජයේ නිශ්චල හා චංචල දේපළ අධිකාරිය සඳහා ලබාගත හැකි බව | 16 |
| 18. | අධිකාරිය විසින් දරනු ලබන ඉඩම් හෝ ඉඩම් පිළිබඳ සම්බන්ධතා අන්සතු කිරීම | 17 |
| 19. | අන්සතු කිරීමේ සාධන පත්‍රයක් අවලංගු කිරීම හෝ අවසාන කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය නො හැකි බව | 17 |
| | **Vඅ වන කොටස** | |
| | **ආණ්ඩුව විසින් අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හවුල් ව්‍යවසායක් පිළිබඳ ගිවිසුමක් අනුව ඉදිකරන ලද නිවාසවල, තට්ටු නිවාසවල සහ වෙනත් යම් ගොඩනැගිලිවල සන්තකය ආපසු ලබා ගැනීම** | |
| 19අ. | Vඅ වන කොටස අදාළ වන නිවාස, තට්ටු නිවාස හෝ වෙනත් ගොඩනැගිලි | 18 |
| 19ආ. | “ගෙවල් හිමියා” සහ “පදිංචිකරු” යන යෙදුම් අර්ථ නිරූපනය කිරීම | 18 |
| 19ඇ. | Vඅ වන කොටස අදාළ වන ගොඩනැගිල්ලක් හිස් කිරීම සම්බන්ධයෙන් වූ බැඳීම | 18 |
| 19ඈ. | සන්තකය ආපසු ලබා ගැනීම සහ නයිසයි ආඥාව භාරදීම සඳහා අධිකරණයට ඉල්ලුම් කිරීම | 19 |
| 19ඉ. | නඩු විභාගය අඩාල ව කල් තැබීම | 19 |
| 19ඊ. | සන්තකය භාර දීම සඳහා රිට් ආඥාවක් නිකුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 20 |
| 19උ. | කුලී අය කර ගැනීම | 21 |

## 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

### පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 19උෟ. | අභියාචනා | 22 |
| 19එ. | Vඅ වන කොටස අදාළ වන ගොඩනැගිලිවලින් නෙරපීම සඳහා වූ සියලුම නඩු සඳහා පමණක් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු බව | 22 |
| 19ඒ. | මුද්දර ගාස්තු | 22 |
| 19ඔ. | අධිකාරියේ සභාපතිවරයාගේ සහතිකය | 23 |
| | **VI වන කොටස** | |
| | **පොදු කරුණු** | |
| 20. | අමාත්‍යවරයාගේ විධාන | 23 |
| 21. | නියෝග | 23 |
| 22. | යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු වීමේ බලය | 24 |
| 23. | සංවර්ධන ප්‍රදේශ තුළ නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත සහ වෙනත් ප්‍රඥප්ති අදාළ කිරීම | 24 |
| 24. | අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය නිලධාරීන් ලෙස සලකනු ලැබිය යුතු බව | 25 |
| 25. | අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව | 25 |
| 26. | මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීම | 25 |
| 26අ. | අධිකාරිය විසින් බලතල යනාදිය පැවරීම | 25 |
| 26ආ. | දඩ මුදල් අය කර ගනු ලැබූ විට, අධිකාරියෙහි අරමුදලට බැර කළ යුතු බව | 25 |
| 27. | රීති සෑදීමට අධිකාරිය සතු බලය | 25 |
| 28. | වැරදි සහ දණ්ඩන | 26 |
| 28අ. | අවසර පත්‍රයෙහි නියම සහ කොන්දේසිවලට පටහැනිව ආරම්භ කරන ලද ඇතැම් සංවර්ධන කටයුතු යනාදිය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | 26 |
| 28ආ. | ඇතැම් අවස්ථාවල දී ඉඩම් සතුකර ගැනීම | 27 |
| 28ඇ. | පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි | 28 |
| 28ඈ. | ආඥාවක් සඳහා වූ ඉල්ලීම දෙනු ලබන කාලය ඇතුළත බැහැර කළ යුතු බව | 29 |
| 29. | අර්ථ නිරූපණය | 29 |
| | සංවර්ධන සැලැස්මෙහි විධිවිධාන සලස්වනු ලැබිය හැකි කාරණා ඇතුළත් උප ලේඛනය | 31 |

## 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ ඇතුළත් වෙනත් නීතිවල සම්බන්ධතා සහ නීති කොටස් පෙන්වන උපලේඛන පටුන


| ඇමුණුම් අංකය | විස්තරය | | මුල් පනතේ යොමුව | පිටුව |
|---|---|---|---|---|
| 01. | 1984 අංක 44 දරන නාගරික සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනතේ සඳහන් විශේෂිත කරුණු ඇතුළත් ඒ පනතේ 2 වන සහ 3 වන වගන්තිවල නියම | | 1 | 33 - 34 |
| 02. | සටහන් අංක 01 | - පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශිත සංවර්ධන ප්‍රදේශයක, පළාත් පාලන ආයතන නිලධරයන් විසින් නීත්‍යානුකූල අවසරයක් නොමැති ව කරන ලද ඇතැම් ක්‍රියා බලාන්විත කිරීමට විධිවිධාන සැලැස්වීමට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 12 වන වගන්තිය | 3 | 35 |
| | සටහන් අංක 02 | - 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 22ආ වන වගන්තිය | 8ඔ | 35 |
| | සටහන් අංක 03 | - 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනතේ “හානියට පත් දේපළ” පිළිබඳ අර්ථය | 8ඔ (2) | 36 |
| | සටහන් අංක 04 | - 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උප වගන්තිය | 14 (4) | 36 - 37 |
| | සටහන් අංක 05 | - 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උප වගන්තිය | 14 (5) | 38 - 39 |
| | සටහන් අංක 06 | - 460 වන අධිකාරය වූ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය සහ 38 වන වගන්තිය | 16 (2) (අ) | 39 - 41 |
| | සටහන් අංක 07 | - 454 වන අධිකාරය වූ රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය | 17 (1) | 42 |
| | සටහන් අංක 08 | - 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තිය | 19උ (1) | 42 - 45 |
| | සටහන් අංක 09 | - 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 321, 322 (1), 322 (2), 325, 326, 328 (ඇ), 329 සහ 330 වන වගන්ති | 19ඌ (2) | 46 - 49 |

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

[සහතිකය සටහන් කළේ 1978 සැප්තැම්බර් මස 6 වන දින]

එල්. ඩී. - ඕ. 65/77

**අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ඇතැම් ප්‍රදේශ ආර්ථික, සමාජයීය සහ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ වූ සැලසුම් කිරීම හා එසේ සංවර්ධනය කිරීම ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.
[§ 2, 1984 අංක 44]

**1**. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 1978 සැප්තැම්බර් මස 06 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය. [1]

## I වන කොටස

### නාගරික සංවර්ධන අධිකාරිය

### පිහිටුවීම සහ එහි සංයුතිය

නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ සභාපතිවරයා පත් කිරීම.
[§ 4, 1984 අංක 44]

**2**. (1) ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වූ ද, මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද අධිකාරියක් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට පිහිටුවනු ලැබිය යුතු ය.

[§ 4, 1984 අංක 44]

(1අ) අධිකාරියේ සභාපතිවරයකු සිටිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ඔහු පත් කරනු ලැබිය යුතු ය;

[§ 4, 1984 අංක 44]

(1ආ) මේ පනතෙහි හෝ නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක "මණ්ඩලයේ සභාපතිවරයා" යන යෙදුම දැක්වෙන කවර අවස්ථාවක වුව ද ඒ වෙනුවට "අධිකාරියේ සභාපතිවරයා" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) මෙම අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ සංස්ථා නාමයෙන් අධිකාරිය විසින් නඩු පවරනු ලැබීම ද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවා තිබිය යුතු ය.

(4) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, අධිකාරිය විසින් ශාඛා කාර්යාල පිහිටුවා, පවත්වාගෙන යාම කරනු ලැබිය හැකි ය.

---

[1] 1984 අංක 44 දරන නාගරික සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනතේ 2 වන හා 3 වන වගන්තියේ මේ පිළිබඳ විධිවිධාන පනත අවසානයේ ඇමුණුම 01 බලන්න.

අමාත්‍යවරයාගේ නියමයකින් ප්‍රදේශ සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම සහ එවැනි නියමයක බලපෑම.

**3**. (1) යම් ප්‍රදේශයක් සංවර්ධනය සඳහා සුදුසු යයි අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් ඒ ප්‍රදේශය (මෙහි මින් මතු ''සංවර්ධන ප්‍රදේශය'' යනුවෙන් සඳහන් කරනු ලබන) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. [2]

(2) යම් ප්‍රදේශයක් සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක ඒ ප්‍රදේශයේ මායිම් සහ ඉම් සළකුණු දක්වමින් ඒ ප්‍රදේශය නිරූපණය කොට දක්වා තිබිය යුතු ය.

(3) අධිකාරිය විසින් සෑම සංවර්ධන ප්‍රදේශයක් ම, ඒ ප්‍රදේශයේ භෞතික හා ආර්ථික උපයෝගිතාව හැකි තරම් සැලසෙන පරිදි සංවර්ධනය කළ යුතු ය.

අධිකාරියේ කළමනාකාර මණ්ඩලයේ සංයුතිය.

**4**. අධිකාරියේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය (මෙහි මින් මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලයකට පවරනු ලැබිය යුතු අතර, ඒ මණ්ඩලය -

(අ) (මෙහි මින් මතු ''සභාපතිවරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2 වන වගන්තිය යටතේ පත් කරන ලද නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගෙන්; [§ 5, 1984 අංක 44]

(ආ) පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන්;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන්;

(ඈ) ඉඩම් විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන්;

(ඉ) මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්; [3] [§ 5, 1984 අංක 44]

(ඊ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන්;

(උ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන්;

(ඌ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන්;

(එ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන්;

(ඒ) නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ ලෙස තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්;

---

2 මෙසේ ප්‍රකාශිත සංවර්ධන ප්‍රදේශයක, පළාත් පාලන ආයතන නිලධරයන් විසින් නීත්‍යානුකූල අවසරයක් නොමැති ව කරන ලද ඇතැම් ක්‍රියා බලාන්විත කිරීමට විධිවිධාන සලස්වන 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 12 වන වගන්තිය ඇමුණුම 02 හි සටහන් අංක 01 යටතේ දක්වා ඇත.

3 1984 අංක 44 දරන පනතේ 5 (2) වගන්තියෙන් කරන ලද මෙම සංශෝධනය 1978. 09. 06 දින සිට ක්‍රියාත්මක විය යුතු ය. (1984 අංක 44 දරන පනතේ 10 වන වගන්තිය අනුව)

(ඔ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සභාපති ලෙස තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්;

(ඕ) මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු, ඒ අධිකාරියෙහි සාමාන්‍යාධිකාරි ලෙස තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්;

(ක) පළාත් පාලන ආයතනවල සම්බන්ධතා නියෝජනය කිරීම පිණිස අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන, රාජ්‍ය නිලධරයන් නොවන, සාමාජිකයන් දෙදෙනෙකුගෙන්;

(ග) නාගරික සංවර්ධනය පිළිබඳ දැනීමක් සහ පළපුරුද්දක් ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් නම යෝජනා කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) යම් තැනැත්තෙක් -

(අ) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයෙක් නම් හෝ මන්ත්‍රීවරයකු වුවහොත්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියෙක්ව සිටීම අවසන් වුවහොත්,

ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස නම යෝජනා කරනු ලැබීම සඳහා හෝ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තවදුරටත් සිටීම සඳහා හෝ සුදුස්සකු නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ), (ක) සහ (ග) ඡේද යටතේ අමාත්‍යවරයා විසින් නම යෝජනා කරන ලද සභාපතිවරයා සහ සාමාජිකයන්, (4) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු අතර, නැවත නම යෝජනා කරනු ලැබීම සඳහා සුදුස්සන් විය යුතු ය.

(4) සභාපතිවරයා හෝ යම් සාමාජිකයෙක් -

(අ) (2) වන උපවගන්තියෙහි සඳහන් කරන ලද යම් නුසුදුසුකමකට යටත් වුවහොත්; හෝ

(ආ) කායික අබලතාව හෝ සිහි විකලතාව නිසා ස්වකීය කාර්යයන් ඉටු කිරීමට නිත්‍ය වශයෙන් ම නොහැකි තත්ත්වයකට පත් වුවහොත්; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ මතය අනුව, මණ්ඩලය අපකීර්තියට පත්වන අන්දමේ යම් ක්‍රියාවක් හෝ දෙයක් කර ඇත්නම්,

අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සිට (එ) දක්වා වූ ඡේද යටතේ නම යෝජනා කරන ලද කිසිම සාමාජිකයකු, ඒ සාමාජිකයාගේ නම යෝජනා කළ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ සභාපතිවරයා විසින් හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් ධුරය හිස් කරනු ලැබූ හෝ ඉහත සඳහන් උපවගන්තියේ විධිවිධාන යටතේ ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබූ විටක, ඒ සභාපතිවරයාගේ හෝ වෙනත්

සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකුගේ නම යෝජනා කරනු ලැබිය හැකි ය;

එසේ වුව ද, (1) වනඋපවගන්තියේ (ආ) ඡේදයේ සිට (එ) ඡේදය තෙක් වූ ඡේද යටතේ නම යෝජනා කරන ලද සාමාජිකයකු විසින් එසේ ධුරය හිස් කරන ලද නම් හෝ ඒ ඡේද යටතේ නම යෝජනා කරන ලද සාමාජිකයකු එසේ ධුරයෙන් ඉවත් කරන ලද නම්, ඒ සාමාජිකයාගේ නම යෝජනා කළ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැති ව, මේ උපවගන්තිය යටතේ කිසිම නම් යෝජනා කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(6) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට තාවකාලිකව ඔහුගේ ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයා ලෙස ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකුගේ නම යෝජනා කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, එසේ තම ධුරයේ කාර්යයන් ඉටු කිරීමට නොහැකි වන සාමාජිකයා (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සිට (එ) ඡේදය තෙක් වූ ඡේද යටතේ නම යෝජනා කරන ලද සාමාජිකයෙක් නම්, ඒ සාමාජිකයාගේ නම යෝජනා කළ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැති ව, මේ උපවගන්තිය යටතේ කිසිම නම යෝජනා කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(7) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන්, මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වීමට හැකි ය.

(8) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, ඉවත් කිරීමට හේතු නොදක්වා, යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර ඒ ඉවත් කිරීම ගැන යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය;

එසේ වුව ද, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සිට (එ) ඡේදය තෙක් වූ ඡේද යටතේ නම යෝජනා කරන ලද සාමාජිකයකු, ඒ සාමාජිකයාගේ නම යෝජනා කළ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැති ව මේ උපවගන්තිය යටතේ ඉවත් කරනු නොලැබිය යුතු ය.

(9) මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(10) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සිට (එ) ඡේදය තෙක් වූ ඡේද යටතේ නම යෝජනා කරන ලද සාමාජිකයන් විසින්, (4) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(11) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් සාමාජිකයන්ගෙන් කෙනෙකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(12) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු ය. මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(13) මණ්ඩලය විසින් මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරනු ලැබීමේ දී, කටයුතු කරනු ලැබීමේ දී හෝ කාර්යයන් ඉටු කරනු ලැබීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට ඒ මණ්ඩලය යටත් විය යුතු ය.

(14) මණ්ඩලය විසින් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යම් වෙළෙඳ ව්‍යාපාරයක් පිළිබඳව කෙළින් ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් දක්වන මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඒ සම්බන්ධතාවේ ස්වභාවය ඒ වෙළෙඳ ව්‍යාපාරය ගැන සාකච්ඡා කරනු ලබන මණ්ඩලයේ රැස්වීමේ දී එළිදරව් කළ යුතු ය. ඒ එළිදරව් කිරීම මණ්ඩලයේ රැස්වීම් වාර්තාවල සටහන් කරනු ලැබි යුතු ය. ඒ වෙළෙඳ ව්‍යාපාරය පිළිබඳ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගී නොවිය යුතු අතර එවැනි යම් සාකච්ඡාවක් පවත්වනු ලබන විට හෝ එවැනි යම් තීරණයක් ගනු ලබන විට, ඔහු ඒ රැස්වීමෙන් ඉවත යා යුතු ය.

(15) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයෙකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

**5.** (1) නිසි පරිදි මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කටයුතු කරගෙන යාම සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය කරන යම් තැනැත්තන් සංඛ්‍යාවකගෙන් සමන්විත කාරක සභා, මණ්ඩලය විසින් පිහිටුවනු ලැබිය හැකි ය. කාරක සභා පිහිටුවීමට මණ්ඩලයට ඇති බලය.

(2) මණ්ඩලයේ බලතල, කටයුතු හා කාර්යයන් අතුරින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් බලතල, කටයුතු හා කාර්යයන් මණ්ඩලය විසින් ඒ කාරක සභාවලට පවරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සෑම කාරක සභාවක් ම ඒ කාරක සභාවේ රැස්වීම් සඳහා ගණපූරණය ද, අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද තීරණය කළ යුතු ය.

**6.** (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තිබිය යුතු ය. අධිකාරියේ මුද්‍රාව.

(2) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතු ය.

**7.** (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින්, ඔහු තීරණය කරන එක් එක් සංවර්ධන ප්‍රදේශය සඳහා උපදේශක කාරක සභාවක් පිහිටුවනු ලැබිය හැකි ය. උපදේශක කාරක සභා පිහිටුවීම.

(2) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන යම් කරුණක් හෝ සියලු කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම ඒ එක් එක් උපදේශක කාරක සභාවේ කාර්යය විය යුතු ය.

(3) ඒ එක් එක් උපදේශක කාරක සභාවට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් සාමාජික සංඛ්‍යාවක්, ඔහු විසින් තීරණය කරනු ලබන නියම හා කොන්දේසි මත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) ඒ එක් එක් උපදේශක කාරක සභාවට රැස්වීම්වල ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව තීරණය කිරීමේ බලය ද ඇතුළුව, එහි කාර්ය පටිපාටිය නියම කිරීමේ හා විධිමත් කිරීමේ බලය ඒ එක් එක් උපදේශක කාරක සභාවට තිබිය යුතු ය. සෑම සාමාජිකයකු ම විසින්, ඔහු කලින් ඉල්ලා අස් වුවහොත්, මිය ගියහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, අවුරුදු තුනක් ධුරය දැරිය යුතු ය.

(5) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් යම් සාමාජිකයකුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) ඉල්ලා අස්වීමෙන් හෝ ස්වකීය ධුර කාලය ඉකුත් වීමෙන් හෝ ස්වකීය ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(7) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සාමාජිකයකුට ස්වකීය ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(8) උපදේශක කාරක සභාවක යම් සාමාජිකයකු ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකතහොත්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඔහු විසින් ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### බලතල හා කටයුතු

**8**. ජාතික භෞතික නිර්මාණ දෙපාර්තමේන්තුව විසින් තත් කාර්ය සඳහා සකස් කරන ලද යම් නියමු උපදෙස්වලට යටත් ව, යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත අධිකාරියේ බලතල හා කටයුතු පහත සඳහන් ඒවා විය යුතු ය:- අධිකාරියේ බලතල හා කටයුතු. [§ 16, 2000 අංක 49]

(අ) අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට දෙනු ලැබිය හැකි යම් විධානවලට යටත් ව, ඒ ප්‍රදේශ ඇතුළත සහ ප්‍රදේශ අතර ඒකාබද්ධ වූ සැලසුම් කිරීම සහ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම ක්‍රියාත්මක කිරීම;

(ආ) අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට දෙනු ලැබිය හැකි යම් විධානවලට යටත් ව, ඒ ප්‍රදේශවල ඒකාබද්ධ වූ සැලසුම් කිරීමට අනුකූල වන සංවර්ධන වැඩ, ක්‍රියා සහ සේවා පිළිබඳ සම්බන්ධිත වැඩ පිළිවෙළවල් ඒ ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ප්‍රාග්ධන ආයෝජන සැලසුම් ද ඇතුළුව සංවර්ධන සැලසුම් පිළියෙළ කිරීම සහ ආණ්ඩුවේ අනුමතිය සඳහා අමාත්‍යවරයා වෙත ඒවා ඉදිරිපත් කිරීම;

(ඇඇ) ජාතික වැසි ජල ප්‍රතිපත්තියට සහ 8අ වන වගන්තිය ප්‍රකාර ව පිළියෙල කරනු ලැබූ සංවර්ධන සැලැස්මෙහි ඇතුළත් කිරීමට නියමිත උපක්‍රමයන්ට අනුකූල ව වැසි ජලය එක්රැස් කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම; [§ 2, 2007 අංක 36]

(ඈ) ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට භාර ගැනීම;

(ඉ) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ සියලු ගිවිසුම් සහ සම්මුතිවලට ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටත යම් තැනැත්තන් සමග කෙළින් ම හෝ බද්ධ ව්‍යවසාය වශයෙන් හෝ ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම; [§ 2, 1982 අංක 4]

(ඊ) යම් තැනැත්තකු විසින් සම්පූර්ණ කිරීම පැහැර හරින ලද අනුමත සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් සම්පූර්ණ කිරීම සඳහා භාර ගැනීම;

(උ) ආණ්ඩුව විසින් අනුමත කරන ලද සංවර්ධන සැලසුම් සහ ප්‍රාග්ධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම;

(ඌ) ඒ ප්‍රදේශවල ප්‍රාග්ධන වැඩ දියුණු කිරීමේ වැඩ පිළිවෙළවල් සකස් කිරීම;

(එ) ඒ ප්‍රදේශ තුළ නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම;

(ඒ) ඒ ප්‍රදේශවල පරිසර තත්ත්වයන් වර්ධනය කිරීම සහ පරිසරය දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම පිළියෙළ කිරීම;

(ඔ) ඒ ප්‍රදේශවල අධෝව්‍යුහ සංවර්ධනයට සම්බන්ධ ගොඩනැගිලි කටයුතු, ඉංජිනේරු කටයුතු සහ වෙනත් කටයුතු ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධ යම් වැඩක් කිරීමට භාර ගැනීම;

(ඕ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම සහ දැරීම සහ අධිකාරිය විසින් අත්කර ගන්නා ලද හෝ දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් බැහැර කිරීම;

(ක) ඒ ප්‍රදේශවල නිවාස යෝජනා ක්‍රම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ග) මුඩුක්කු සහ පැල්පත් පිහිටි ප්‍රදේශවලින් ඒ මුඩුක්කු සහ පැල්පත් ඉවත් කිරීමට සැලැස්වීම සහ ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීමට භාර ගැනීම;

(ච) ආණ්ඩුවේ යම් නියෝජිත ආයතනයක ඉල්ලීම පිට, ඒ නියෝජිත ආයතනය වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති සහ සැලසුම් යෝජනා ක්‍රම පිළියෙළ කිරීම සහ ඒ ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම;

(ජ) ඒ ප්‍රදේශවල, යම් තැනැත්තකුගේ යම් සංවර්ධන යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් හෝ යම් සංවර්ධන ක්‍රියාකාරකමක් සම්බන්ධීකරණය කිරීම, නියාමනය කිරීම හෝ පාලනය කිරීම පිණිස; [§ 2, 1982 අංක 4] [§ 16, 2000 අංක 49]

(ට) ඒ ප්‍රදේශ තුළ ආණ්ඩුවේ නියෝජිත ආයතනවල හෝ වෙනත් තැනැත්තන්ගේ යහපත යහපත සඳහා කාර්මික සැලසුම් සේවා සැපයීම;

(ඩ) ඒ ප්‍රදේශ තුළ යම් ආණ්ඩුවේ නියෝජිත ආයතනයක් විසින් හෝ වෙනත් තැනැත්තන් විසින් හෝ සකස් කරන ලද යම් සැලසුම් ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම විධිමත් කිරීම;

(ණ) ආණ්ඩුවේ විධානය පරිදි, අධිකාරිය විමසා, යම් සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම භාර ගන්නා ලෙස ආණ්ඩුවේ යම් නියෝජිත

ආයතනයකින් ඉල්ලා සිටීම සහ ඒ ව්‍යාපෘතිවල හෝ යෝජනා ක්‍රමවල කටයුතු විධිමත් කිරීම;

(ත) අධිකාරිය විසින් සපයනු ලබන යම් ගොඩනැගිල්ලක් සඳහා හෝ යම් සේවා සඳහා කුලී හෝ යම් ගාස්තු අය කිරීම;

(ද) මුදලින් හෝ අන්‍යාකාරයක වූ හෝ තෑගි, ප්‍රදාන, පරිත්‍යාග හෝ සහනාධාර භාර ගැනීම සහ අධිකාරියේ යම් පරමාර්ථයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා අදාළ කර ගැනීම; සහ

(න) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කටයුතු සහ කාර්ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට ආනුෂංගික හෝ අනුයාත වන සියලු ක්‍රියා හෝ දේ කිරීම.

## IIඅ වන කොටස

[§ 3, 1982 අංක 4]

### සැලසුම් කිරීමේ කාර්ය පටිපාටිය

සංවර්ධන සැලසුම් යනාදිය පිළියෙළ කිරීම. [§ 3, 1982 අංක 4]

**8අ.** (1) සංවර්ධන ප්‍රදේශයක හෝ එහි කොටසක, ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ ව ඒකාබද්ධ වූ සැලසුම් කිරීම සහ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීමේ සහ විධිමත් කිරීමේ අදහස ඇතිව අධිකාරිය විසින්, ප්‍රජාව වෙත සලසා දෙනු ලබන පහසුකම් සහ සේවාවන් ගැන සැලකිලිමත් ව ඒ සංවර්ධන ප්‍රදේශය හෝ එහි කොටස හෝ සඳහා සංවර්ධන සැලැස්මක පිළියෙළ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, මේ පනතේ උපලේඛනයේ විධිවිධාන සලසා ඇති කරුණු සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් විධිවිධාන, සංවර්ධන සැලැස්මක අඩංගු විය හැකි ය.

සැලසුම් කිරීමේ කමිටු පත් කිරීම. [§ 3, 1982 අංක 4]

**8ආ.** (1) සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමට, ක්‍රියාවේ යෙදවීමට සහ බලාත්මක කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් දීමේ කාර්යය සඳහා මෙහි මින් මතු "සැලසුම් කිරීමේ කමිටු" යනුවෙන් සඳහන් කරනු ලබන කමිටුවක්, 5 වන වගන්තිය ප්‍රකාර පත් කරනු ලැබිය යුතු ය.

(2) සැලසුම් කිරීමේ කමිටුව විසින් කටයුතු කරගෙන යාම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු යනාදිය ඉල්ලා සිටීමට අධිකාරියට ඇති බලය. [§ 3, 1982 අංක 4]

**8ඇ.** (1) සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා අධිකාරිය විසින් එම සංවර්ධන ප්‍රදේශයෙහි හෝ එහි කොටසෙහි පරිපාලන සීමාව තුළ පිහිටා ඇති පළාත් පාලන ආයතනයට හෝ පළාත් පාලන ආයතනවලට හෝ එම ප්‍රදේශයෙහි යම් තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, ඒ දැන්වීමෙහි සඳහන් කාලසීමාව තුළ දී-

(අ) අධිකාරියේ මතයට අනුව අවශ්‍ය ලෙස සලකන්නා වූ ද, දැන්වීමෙහි සඳහන් කරනු ලබන්නා වූ ද තොරතුරු සපයන ලෙස;

(ආ) පළාත් පාලන ආයතනය හෝ පළාත් පාලන ආයතන හෝ ඒ තැනැත්තා හෝ විසින් ප්‍රයෝජනවත් යයි සලකනු ලබන නිර්දේශ කිසිවක් වේ නම්, ඒ නිර්දේශ ඉදිරිපත් කරන ලෙස;

සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේ දී නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් නීතියක විධිවිධාන යටතේ එම තොරතුරු සැපයීමෙන් පළාත් පාලන ආයතන හෝ තැනැත්තා හෝ වළක්වනු ලැබ ඇති අවස්ථාවක හැර, එම දැන්වීමෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ දී එහි නියමයන් අනුව කටයුතු කිරීම (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් මගින් යම් තොරතුරු සපයන ලෙස නියම කරනු ලැබ සිටින පළාත් පාලන ආයතනයක හෝ යම් තැනැත්තකුගේ හෝ කාර්ය විය යුතු ය.

කෙටුම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම. [§ 3, 1982 අංක 4]

**8අ.** කෙටුම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කරනු ලැබූ විට, අධිකාරිය විසින්, ඒ සැලැස්මේ පිටපතක්, පිළියෙල කරන ලද එම සැලැස්ම අදාළ වන සංවර්ධන ප්‍රදේශයෙහි හෝ එහි කොටසෙහි පරිපාලන සීමා තුළ පිහිටි පළාත් පාලන ආයතනය හෝ ආයතන වෙත එම පළාත් පාලන ආයතනයෙහි හෝ ආයතනවල නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම කෙටුම්පත් සැලැස්ම ලැබී දින හැටක් ඇතුළත දී, ඒ පිළිබඳව එම පළාත් පාලන ආයතනයේ හෝ ආයතනවල නිරීක්ෂණ කිසිවක් වේ නම් ඒ නිරීක්ෂණ අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම ඒ පළාත් පාලන ආයතනයේ හෝ ආයතනවල කාර්ය විය යුතු ය.

කෙටුම්පත් සංවර්ධන සැලැස්ම සැලසුම් කිරීමේ කමිටු විසින් පරීක්ෂා කොට අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු බව. [§ 3, 1982 අංක 4]

**8ඉ.** (1) 8අ. වන වගන්තියෙහි සඳහන් දින හැටක කාල සීමාව ඉකුත් වුනු විට, කෙටුම්පත් සැලැස්ම, ඒ වගන්තිය යටතේ ලැබුණු නිරීක්ෂණ කිසිවක් වේ නම් ඒවා ද සමග සැලසුම් කිරීමේ කමිටුව විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, ඒ පරීක්ෂණයෙන් පසු හැකි පහසු ඉක්මණින් සැලසුම් කිරීමේ කමිටුව විසින් එම සංවර්ධන සැලැස්ම, ඒ පිළිබඳ එහි නිර්දේශයන් ද සමග අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කෙටුම්පත් සංවර්ධන සැලැස්ම අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, අධිකාරිය විසින්, ඒ සංවර්ධන සැලැස්ම, ඒ පිළිබඳ එහි නිර්දේශ ද සමග එය අනුමත කරනු ලැබීම හෝ වෙනස් කරනු ලැබීම සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සංවර්ධන සැලැස්ම අනුමත කිරීම. [§ 3, 1982 අංක 4]

**8ඊ.** 8ඉ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කෙටුම්පත් සංවර්ධන සැලැස්ම අධිකාරිය විසින් එවනු ලැබූ විට, එම සැලැස්ම සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරන ලද නිර්දේශ සලකා බැලීමෙන් පසුව අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනස් කිරීම් හෝ මඳ වශයෙන් වෙනස් කිරීම් හෝ කිසිවක් වේ නම්, ඒවාට යටත් ව, සංවර්ධන සැලැස්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය.

සංවර්ධන සැලැස්ම අනුමත කිරීම යනාදිය පිළිබඳ දැන්වීම. [§ 3, 1982 අංක 4]

**8උ.** අමාත්‍යවරයා විසින් යම් කෙටුම්පත් සංවර්ධන සැලැස්මක් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ අනුමත කිරීමෙන් පසුව හැකි පමණ ඉක්මණින්-

(අ) සංවර්ධන සැලැස්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇති බවට සහ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි එය ක්‍රියාත්මක වන බවට දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ සංවර්ධන ප්‍රදේශයෙහි හෝ ඉන් කොටසක සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය; තව ද

(ආ) කොළඹ පිහිටි අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයයේ හෝ අධිකාරියේ වෙනත් කාර්යාලවල හෝ සංවර්ධන සැලැස්ම අදාළ වන සංවර්ධන ප්‍රදේශයේ හෝ ඉන් කොටසක නැතහොත් ඒ අසල පිහිටා ඇති පළාත් පාලන ආයතන කාර්යාලයයේ හෝ පළාත් පාලන ආයතන කාර්යාලවල හෝ මහජනයා විසින් පරීක්ෂා කර බැලීම සඳහා

සංවර්ධන සැලැස්ම සමග ලිඛිත ප්‍රකාශය, සැලසුම්, පිඹුරු සහ එහි ඇමුණුම් ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

සංවර්ධන සැලැස්ම සංශෝධනය කිරීම යනාදිය.
[§ 3, 1982 අංක 4]

**8ඌ.** (1) සංවර්ධන ප්‍රදේශයක හෝ ඉන් කොටසක සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමෙන් පසු යම් අවස්ථාවක අධිකාරිය විසින්, සංවර්ධන සැලැස්මෙහි දක්වා ඇති පහසුකම් සහ සේවාවන් සැලකිල්ලට ගෙන සංවර්ධන සැලැස්මෙහි සංශෝධන, ප්‍රතියෝජන, ප්‍රතිශෝධන හෝ මඳ වශයෙන් වෙනස් කිරීම් අවශ්‍ය හෝ යෝග්‍ය වන අවස්ථාවක, සංවර්ධන ප්‍රදේශයෙහි හෝ ඉන් කොටසක යම් විශේෂ කොටසකට හෝ කොටස්වලට සංවර්ධන සැලැස්ම අදාළ වන තාක් දුරට, එය සංශෝධනය කිරීම, ප්‍රතියෝජනය කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ මඳ වශයෙන් වෙනස් කිරීම අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සංවර්ධන සැලැස්මක සංශෝධනය, ප්‍රතියෝජනය, ප්‍රතිශෝධනය හෝ මඳ වශයෙන් වෙනස් කිරීම සම්බන්ධයෙන් 8ඇ, 8ඈ, 8ඉ, 8ඊ සහ 8උ වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

සංවර්ධන ප්‍රදේශවල සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම සඳහා අවසර පත්‍ර.
[§ 3, 1982 අංක 4]
[§ 16, 2000 අංක 49]

**8එ.** (1) අධිකාරිය විසින් එහි ලා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර, යම් සංවර්ධන ප්‍රදේශයක හෝ එහි කොටසක යම් සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම, කිසිදු තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.[4]

(2) සංවර්ධන ප්‍රදේශයක හෝ ඉන් කොටසක සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම හෝ සඳහා ඉල්ලුම්පතක් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක විය යුතු අතර, එසේ නියම කරනු ලබන තොරතුරු එහි අඩංගු විය යුතු ය. තව ද එසේ නියම කරනු ලබන ගාස්තු ද ඒ සමග විය යුතු ය.

(3) (අ) සංවර්ධන සැලැස්ම අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති හෝ සංවර්ධන සැලැස්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇති යම් විටක ක්‍රියාත්මක කිරීමට හෝ නිරතවීමට අපේක්ෂිත සංවර්ධන කටයුත්ත ඒ සංවර්ධන සැලැස්මෙහි යම් යෝජනාවකට හෝ විධිවිධානයකට අනනුකූල නැතහොත් පටහැනි නොවන බවට; සහ

(ආ) කිසිදු සංවර්ධන සැලැස්මක් පිළියෙල කරනු නොලැබූ යම් විටක, ඒ සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කිරීම හෝ සංවර්ධන කටයුත්තෙහි නිරතවීම සඳහා අවසර පත්‍රයක් අවශ්‍ය වන්නේ යම් කාර්යයක් සඳහා ද, ඒ කාර්ය ඒ ප්‍රදේශයේ අනාගත සංවර්ධනයෙහි ලා අනුකූල වන බවට,

අධිකාරිය සෑහීමට පත් වේ නම් (1) වන උපවගන්තිය යටතේ අවසර පත්‍රයක්, අධිකාරිය අවශ්‍ය යයි සලකනු ලබන ඒ කොන්දේසිවලට යටත් ව, අධිකාරිය විසින් ඒ උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

[4] 2000 අංක 49 දරන පනතෙන් මෙම වගන්තියට කරන ලද සංශෝධනයේ දී උපවගන්තියට දෙන ලද යොමුව (8එ වගන්තිය යන්නට 8ඒ යනුවෙන් සඳහන් වේ.) සහ 1982 අංක 4 දරන පනතේ මුල් වචනවලට දී ඇති සම්බන්ධතාව ගැටළු සහගත ය. කෙසේ වුව ද, මේ වගන්තියෙන් අපේක්ෂා කරන අර්ථය විදහා දැක්වෙන පරිදි ගැලපීමට ක්‍රියා කර ඇත.

(4) මේ වගන්තිය යටතේ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමේ දී හෝ නිකුත් කිරීමේ දී හෝ නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ දී අධිකාරිය විසින් කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමට අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ සාදන ලද නියෝගවලට යටත් ව, ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචන කරනු ලැබිය හැකි අතර, එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(6) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අවුරුදු එකක කාලසීමාවක් සඳහා වලංගු වන්නේ ය;

එසේ වුව ද අවසර පත්‍රයෙහි සඳහන් සංවර්ධන කටයුත්ත ආරම්භ කරනු ලැබ ඇති නමුත් අනපේක්ෂිත අවස්ථානුගත කරුණු නිසා අවසන් කර නොමැති බවට අධිකාරිය සෑහීමට පත් වේ නම්, ඉල්ලීමක් කිරීම මත, අධිකාරිය විසින් අවසර පත්‍රයෙහි වලංගු කාලය අවුරුදු දෙකක් නොඉක්මවන වැඩිදුර කාලසීමාවක් හෝ කාලසීමා හෝ සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය;

එසේ ම තවදුරටත් අවසර පත්‍රයක කාලය අවසන් වීමේ හේතුවෙන් එම කාර්ය සඳහා යම් තදනන්තර ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම වළක්වනු නොලැබිය යුතු ය.

**8ඒ.** (1) සංවර්ධන කටයුතු සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයකට පටහැනි ලෙස හෝ ඊට වෙනස් වන ලෙස, කිසිදු සංවර්ධන කටයුත්තක් ක්‍රියාත්මක කිරීම හෝ සංවර්ධන කටයුත්තක නිරතවීම හෝ කරනු නොලැබිය යුතු ය.

සංවර්ධන කටයුතු අවසර පත්‍රය යනාදියට අනුකූල විය යුතු බව.
[§ 3, 1982 අංක 4]

(2) යම් සංවර්ධන කටයුත්තක් සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ යම් සංවර්ධන කටයුත්තක් යම් තැනැත්තකු විසින් සම්පූර්ණ කරනු ලැබූ විට, ක්‍රියාත්මක කරන ලද හෝ නිරතව සිටි සංවර්ධන කටයුත්ත, ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයට අනුකූලව කරන ලද බවට අධිකාරිය වෙතින් සහතිකයක් ඉල්ලුම්කර, ලබා ගැනීම එම තැනැත්තාගේ කාර්යය වන්නේ ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අනුකූලතා සහතිකයක් ලැබුණු විට, කිසිදු ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්, ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි සඳහන් කාර්ය නොවන වෙනත් යම් කාර්ය සඳහා පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් ගොඩනැගිල්ලක පදිංචි වන්නා වූ හෝ පදිංචිවීමට ඉඩ දෙනු ලබන්නා වූ යම් තැනැත්තකු, වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. තව ද ඒ වරද නොකඩව කරනු ලබන වරදක් වන අවස්ථාවක, ඒ කඩකිරීම නොකඩව කරනු ලබන එක් එක් දවස සඳහා රුපියල් එක් සියයක අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය. [§ 6, 1984 අංක 44]

**8ඔ.** (1) යම් සංවර්ධන ප්‍රදේශයක, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 22ආ වන වගන්තිය[5] යටතේ අනුමත කරන ලද දේපළ සංවර්ධන ව්‍යාපෘතියකට ඇතුළත් ගොඩනැගිල්ලක් වන යම් ගොඩනැගිල්ලක් 8ඒ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ හා ඊට අනුකූලව ඉදිකර ඇති අවස්ථාවක

වරිපනම් අඩු කිරීම.
[§ 2, 1987 අංක 49]
[§ 2, 1988 අංක 41]

[5] 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 22ආ වන වගන්තිය ඇමුණුම 2 හි සටහන් අංක 02 යටතේ දක්වා ඇත.

මහා නගර සභා ආඥාපනතෙහි හෝ නගර සභා ආඥාපනතෙහි හෝ කුමක් සඳහන් ව ඇත ද-

(අ) එම ඉදිකිරීම සම්බන්ධයෙන් ප්‍රථම තක්සේරුවේ දිනයෙහි සිට ගණන් ගත යුතු අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා එවැනි යම් ආඥාපනතක් යටතේ එම ගොඩනැගිල්ල සඳහා තක්සේරු කරන ලද වරිපනම් බද්දෙන් සියයට අසූවක අඩු කිරීමකට අවස්ථාවෝචිත පරිදි මහා නගර සභාව හෝ නගර සභාව විසින් ඉඩ දිය යුතු ය; තව ද,

(ආ) (අ) ඡේදයේ සඳහන් කාල පරිච්ඡේදය ඉකුත් වීමේ සිට ගණන් ගත යුතු අවුරුදු පහක වැඩි දුර කාල පරිච්ඡේදයක් සඳහා එම වරිපනම් බදුවල සියයට පණහක අඩු කිරීමකට අවස්ථාවෝචිත පරිදි, මහා නගර සභාව හෝ නගර සභාව විසින් ඉඩ දිය යුතු ය.

(2) 8ඒ වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ හා ඊට අනුකූලව යම් සංවර්ධන ප්‍රදේශයක 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනතේ අර්ථානුකූලව[6] හානියට පත් දේපළක් වන යම් ගොඩනැගිල්ලක් ප්‍රතිසංවර්ධනය කර ඇති විටෙක, මහා නගර සභා ආඥාපනතේ හා නගර සභා ආඥාපනතේ කුමක් සඳහන් ව ඇත ද එම ප්‍රති සංවර්ධනය පිළිබඳව 8ඒ [7] වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයේ දිනයේ සිට ගණන් ගත යුතු අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා එසේ ප්‍රතිසංවර්ධනය කරන ලද ගොඩනැගිල්ල සඳහා තක්සේරු කරන ලද වරිපනම් බද්දෙන් සියයට පණහක අඩු කිරීමකට අවස්ථාවෝචිත පරිදි, මහා නගර සභාව හෝ නගර සභාව විසින් ඉඩ දිය යුතු ය. [8] [§ 2, 1988 අංක 41]

## III වන කොටස

## මුදල්

අධිකාරියේ අරමුදල්.

**9**. (1) අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදලට-

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා ජාතික රාජ්‍ය සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කටයුතු කිරීමේ දී හා කාර්යයන් ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල්; සහ

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ ඉන් පිටත හෝ කවර හෝ ප්‍රභවයන්ගෙන් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

---

6 1987 අංක 29 දරන පනතේ හානියට පත් දේපළෙහි අර්ථය, ඇමුණුම 2 හි සටහන් අංක 03 යටතේ දක්වා ඇත.

7 1987අංක 49 පනතේ 2 වන වගන්තිය මගින් කරන ලද මේ සංශෝධනයේ මේ වගන්තියේ අංකය සාවද්‍ය ලෙස “8ඔ” යනුවෙන් මුද්‍රණය වී ඇත. එය “8ඒ” වශයෙන් නිවැරදි විය යුතු ය.

8 ප්‍රධාන ප්‍රඥප්තියේ 8ඔ වන වගන්තිය එකතු කරමින් කරන ලද සංශෝධනය සහ එම වගන්තියේ (1) වන උපවගන්තියට කරන ලද සංශෝධනය 1979 නොවැම්බර් මස 12 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. (1987 අංක 49 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 3 වන වගන්තිය සහ 1988 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 4 වන වගන්තිය)

(2) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කටයුතු කිරීමේ දී හා කාර්යයන් ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් වියදම් ගෙවීමට අවශ්‍ය සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දස කෝටියක් විය යුතු ය. ආරම්භක ප්‍රාග්ධනයේ මුදල, අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වාර මුදල්වලින්, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට ඒ මුදල් බැර කරනු ලැබිය යුතු ය. [§ 2, 1979 අංක 70]

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

**10**. (1) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධිකාරියේ මුදල් පාලනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

මණ්ඩලයේ ණයට ගැනීම් පිළිබඳ බලතල.

**11**. (1) මේ පනත යටතේ, අධිකාරියේ බැඳීම් ඉටු කිරීම සඳහා හෝ අධිකාරියේ කාර්යයන් ඉටු කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය වන මුදල් අයිරාවක මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම් පොදු අනුමැතියක නියමයන්ට අනුකූලව, තාවකාලිකව ණයට ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද යම් තාවකාලික ණයක් සම්බන්ධයෙන් යම් අවස්ථාවක දී ගෙවීමට තිබෙන මුදල්වල එකතුව අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, තීරණය කරනු ලබන මුදලක් නොඉක්මවිය යුතු ය.

(2) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබාගෙන, අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව, මණ්ඩලය විසින්, (1) වන උපවගන්තිය යටතේ තාවකාලික ණය ලබා ගැනීමෙන් හැර, සෘණ පත්‍ර නිකුත් කිරීමෙන් අධිකාරියේ කාරක ප්‍රාග්ධනය හෝ ආයෝජන ප්‍රාග්ධනය සැපයීම සඳහා මුදල් ණයට ලබා ගනු ලැබිය හැකි ය. එසේ ඇති කොට, නිකුත් කරන ලද සෘණ පත්‍ර "නාගරික සංවර්ධන අධිකාරියේ සෘණ පත්‍ර" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ. [§ 3, 1979 අංක 70]

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබාගෙන අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමයන්ට අනුව "නාගරික සංවර්ධන අධිකාරියේ සෘණ පත්‍ර" නිකුත් කිරීම, පැවරීම, ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම, ඒවා බේරුම් කිරීම සහ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ ඇපවීම.

**12**. (1) මේ පනත යටතේ නිකුත් කරන ලද සෘණ පත්‍ර සම්බන්ධයෙන් ලැබිය යුතු යම් මුල් මුදලක් ආපසු ගෙවන බවට සහ ඒ මුල් මුදල පිළිබඳ පොලිය ගෙවන බවට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඇප විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඇපවීමක් ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් මුදලක් ජාතික රාජ්‍ය සභාවේ පූර්ව අනුමැතිය ඇතිව, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ඇපවීමක් ඉටු කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවන ලද යම් මුදලක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව තීරණය කරනු ලබන අනුප්‍රමාණයක් අනුව ඒ මුදල පිළිබඳව ගෙවිය යුතු පොලියත් සමග මුදල් විෂය භාර අමාත්‍යවරයා

විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව තීරණය කරනු ලබන ආකාරයකට සහ කාලසීමාවක දී, ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඇපවීමක් වූ වහාම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒ ඇපවීම පිළිබඳව ප්‍රකාශයක් ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වූ ඇපවීමක් ඉටුකිරීමේ ලා ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ මුදල ගෙවන ලද බවට ප්‍රකාශයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ජාතික රාජ්‍ය සභාව වෙත වහාම ඉදිරිපත් කළ යුතු ය.

## IV වන කොටස

### කාර්ය මණ්ඩලය

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.
[§ 7, 1984 අංක 44]

**13**. (1) අධිකාරිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු අතර අමාත්‍යවරයා විසින් අවුරුදු තුනක කාලයක් සඳහා ඔහු පත් කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණ සිටීමේ සහ ඒ රැස්වීම්වල කථා කිරීමේ හිමිකම අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබිය යුතු නමුත්, ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.

(3) අධිකාරියේ කටයුතු අධීක්ෂණය කිරීම, අධිකාරියේ බලතල, කටයුතු සහ කාර්ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අධිකාරියේ සේවා නියුක්තයන්ගේ පරිපාලනමය පාලනය, සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් ව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර විය යුතු ය.

(4) තම බලතල, කටයුතු හෝ කාර්ය අතුරින් කලින් කල පැවරීමට අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන බලතල, කටයුතු හෝ කාර්ය, මණ්ඩලයේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකු වෙත ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි අතර එවැනි යම් බලතල, කටයුතු හෝ කාර්ය පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් ඒ බලතල, කටයුතු හෝ කාර්ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් ව, ක්‍රියාත්මක කළ යුතු ය. [9]

නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම.

**14**. (1) කාර්යක්ෂම ලෙස අධිකාරියේ බලතල ක්‍රියාවේ යෙදවීම, කටයුතු කිරීම සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් සාදනු ලබන රීති මඟින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් සහ එසේ ම නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණ අනුව නිලධරයන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර එසේ නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ද ඔවුන් යටත් විය යුතු ය.

(3) අධිකාරියේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර දෙනු ලැබ ඇත්තේ යම් අමාත්‍යවරයකු වෙත ද, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, අධිකාරියේ

---

9 13 වන වගන්තියේ “සාමාන්‍යාධිකාරිවරයා” යන්නට, “අධ්‍යක්ෂ ජනරාල්වරයා” යනුවෙන් කරන ලද ඇතුළත් කිරීම 1978. 09. 06 දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. (1984 අංක 44 දරන පනතේ 10 වන වගන්තිය)

කාර්ය මණ්ඩලයට එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබීම හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ [10] විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ [11] විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරිය යටතේ සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) අධිකාරියේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ [12] හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇති ව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබීම හෝ විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් සම්බන්ධයෙන් වූ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව, අධිකාරිය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය *** හෝ පළාත් පාලන ආයතනය විසින් එකඟ වනු ලබන නියම සහ කොන්දේසි මත, ඒ සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තියේ විධිවිධාන අනුව යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා ද යටත් විය යුතු ය.

---

[10] 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය, ඇමුණුම 2 හි සටහන් අංක 04 යටතේ දක්වා ඇත.

[11] 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තිය, ඇමුණුම 2 හි සටහන් අංක 05 යටතේ දක්වා ඇත.

[12] 1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතේ 22 වන වගන්තිය අනුව "පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය" යන්න "පළාත් පාලන සේවා කොමිෂන් සභාව" යනුවෙන් තේරුම් ගත යුතු ය.

## V වන කොටස

### නිශ්චල දේපළ අත්කර ගැනීම සහ අධිකාරියට අයත් ඉඩම් විකිණීම.

යම් පළාත් පාලන ආයතනයක බල සීමාව තුළ පිහිටි ඉඩම් සම්බන්ධයෙන් වූ බලය.

**15**. (1) යම් පාළාත් පාලන ආයතනයක් වෙත සතු වී ඇති යම් ඉඩමක් හෝ ඉඩමක් පිළිබඳ සම්බන්ධතාවක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අධිකාරියට අවශ්‍ය යයි අමාත්‍යවරයා සහතික කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ ඉඩම හෝ ඒ ඉඩම පිළිබඳ සම්බන්ධතාව ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් කොන්දේසි තිබේ නම්, ඒවාට යටත් ව, සහ ඒ නියමයෙහි සඳහන් කරනු ලබන දිනයක සිට අධිකාරිය වෙත සතු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන නියමයකින්, ඒ නයමයෙහි සඳහන් යම් ඉඩමක් හෝ යම ඉඩමක් පිළිබඳ සමබන්ධතාවක් සම්බන්ධයෙන් සහ ඒ ඉඩමෙහි යම් ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සම්බන්ධයෙන් පරම අයිතිය ඒ නියමයෙහි සඳහන් දිනයෙහි සිට සියලු බැඳීම්වලින් තොරව අධිකාරිය වෙත පැවරෙන අතර, ඒ ඉඩම හෝ ඉඩම පිළිබඳ සම්බන්ධතාව සම්බන්ධයෙන් හෝ එහි ගොඩනැගිලි හෝ වෙනත් ඉදිකිරීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් කිසිම වන්දියක් ගෙවනු නොලැබිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා දේපළ අනිවාර්යයෙන් අත්කර ගැනීම.

**16**. (1) 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත යම් ප්‍රදේශයක යම් ඉඩමක් හෝ ඉඩමක පිළිබඳ යම් සම්බන්ධතාවක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අධිකාරියට අවශ්‍ය වන අවස්ථාවක, ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව, ආණ්ඩුව විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා අත්කර ගනු ලැබිය හැකි අතර ඒ පනතේ විධිවිධාන සලසා තිබේ නම් හැර, ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව අත්කර ගැනීමේ කාර්යය සඳහා අදාළ විය යුතු ය. ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්යය සඳහා ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

[§ 4, 1982 අංක 4]

(2) එවැනි යම් අත්කර ගැනීමක් සම්බන්ධයෙන් වන විට, ඒ ඉඩම හෝ ඉඩම පිළිබඳ සම්බන්ධතාව අත්කර ගැනීමේ අදහස පිළිබඳ ව ඉඩම් අත්කර ගැනීමේ පනත අනුව අවශ්‍ය ප්‍රසිද්ධ දැන්වීම, යම් ප්‍රදේශයක් සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරමින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙන් ආරම්භ වන අවුරුදු පහක කාලයක් ඇතුළත යම් වේලාවක පළ කරනු ලැබූ අවස්ථාවක, ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, ඉඩම සම්බන්ධයෙන් හෝ එහි සම්බන්ධතාව සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල තීරණය කිරීම සඳහා, ඒ ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වෙළෙඳ වටිනාකම, ඒ ප්‍රදේශය මේ පනත යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරමින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ [13] දිනයෙහි ඒ වෙළෙඳ වටිනාකම සහ-

(අ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ [14] විධිවිධාන යටතේ නියමයක් කර නොමැති කිසියම් ඉඩමක් හෝ ඒ ඉඩම පිළිබඳව වූ යම් සම්බන්ධතාවක් හෝ සම්බන්ධයෙන් වන විට, ඒ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීම, ගැසට් පත්‍රයෙහි පළ

---

[13] 16 (2) උපවගන්තියට මේ ස්ථානයේ සිට කරන ලද සංශෝධනය 1978 ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. (1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 11 වන වගන්තිය)

[14] 460 වන අධිකාරය වූ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය සහ 38 වන වගන්තිය, ඇමුණුම 02 හි සටහන් අංක 06 යටතේ දක්වා ඇත.

කරනු ලැබූ දිනයෙහි ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වෙළෙඳ වටිනාකම; නැතහොත්

(ආ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ විධිවිධාන යටතේ නියමයක් කරනු ලැබ ඇති ඉඩමක් හෝ ඒ ඉඩම පිළිබඳව වූ සම්බන්ධතාවක් හෝ සම්බන්ධයෙන් වන විට එම නියමය පළ කරන ලද දිනයෙහි එහ ඉඩම හෝ එහි සම්බන්ධතාවේ වෙළෙඳ වටිනාකම

අතර වෙනසෙහි සියයට පණහකින් වැඩි වූ ඒ ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වෙළෙඳ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතු ය.

රජයේ නිශ්චල හා චංචල දේපළ අධිකාරිය සඳහා ලබාගත හැකි බව.

**17.** (1) අධිකාරියේ කටයුතු පිළිබඳ කාර්යයන් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය ඒ දේපළ සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය [15] යටතේ විශේෂ වශයෙන් ප්‍රදානය කරනු ලැබිය හැකි හෝ බදු දෙනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, අධිකාරිය වෙත ඒ දේපළ විශේෂ වශයෙන් ප්‍රදානය කරනු ලැබීම හෝ බදු දෙනු ලැබීම සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) අධිකාරියේ කාර්යය සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ යම් රාජ්‍ය සංස්ථාවක යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ චංචල දේපළෙහි සන්තකය සහ පාවිච්චි කිරීම අධිකාරිය වෙත පැවරීම සහ සතු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක යම් නිශ්චල දේපළකට බලපාන කිසිම නියමයක්, ඒ දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව භාර අමාත්‍යවරයාගේ කැමැත්ත නොමැතිව, කරනු නොලැබිය යුතු ය.

අධිකාරිය විසින් දරනු ලබන ඉඩම් හෝ ඉඩම් පිළිබඳ සම්බන්ධතා අන්සතු කිරීම.

**18.** (1) ඉඩම හෝ ඉඩම පිළිබඳ සම්බන්ධතාව අන් සතු කරනු ලබන්නේ යම් පාවිච්චි කිරීමක් හෝ පාවිච්චි කිරීම් සඳහා ද ඒ පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීම් පිළිබඳ නියම හා කොන්දේසි ඇතුළත් සහ විශේෂයෙන් ම, එහෙත් මේ වගන්තියේ [16] ඉහත දැක්වෙන විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, අන්සතු කිරීමේ සාධන පත්‍රය මගින් කරනු ලබන අන්සතු ඒ සාධන පත්‍රයෙහි දක්වා ඇති වෙනත් යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමක් සිදු වූ විට හෝ ඒ සාධන පත්‍රය යටතේ අධිකාරියට අයවිය යුතු යම් මුදලක් එහි සඳහන් යම් කාලයක් දක්වා ගෙවා නොමැති විට, අවලංගු කළ යුතු බවට හෝ අවසන් කළ යුතු බවට වූ කොන්දේසියක් ද ඇතුළත්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන හා අන්සතු කිරීමේ සාධන පත්‍රයෙහි දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත් ව, අධිකාරිය විසින් දරනු ලබන යම් ඉඩමක් හෝ ඉඩමක් පිළිබඳ සම්බන්ධතාවක් අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව, අධිකාරිය විසින් විකිණීමෙන්, බදු දීමෙන්, කුලියට දීමෙන් හෝ කුලී සින්නක්කර ක්‍රමයට දීමෙන් නාගරික සංවර්ධන කාර්යය සඳහා අන් සතු කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් දරනු ලබන යම් රජයේ ඉඩමක් යම් නාගරික සංවර්ධනයක් පිළිබඳ කාර්යය සඳහා අන්සතු කිරීම කෙරෙහි රජයේ ඉඩම්

---

[15] 454 වන අධිකාරය වූ රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය, ඇමුණුම 02 හි සටහන් අංක 07 යටතේ දක්වා ඇත.

[16] මෙහි සඳහන් වන්නේ "මේ වගන්තියෙහි" යන්න, "මේ කොටසෙහි" යනුවෙන් නිවැරදි විය යුතු ය.

ආඥාපනතේ ඇති කිසිවක් බලනොපෑ යුතු අතර එසේ බලපාන ලෙසින් ඒ කිසිවක් සැලකීම හෝ තේරුම් ගැනීම ද නොකළ යුතු ය.

**19**. වෙනත් යම් නීතියක පටහැනි විධිවිධාන සඳහන් ව ඇත ද, අන්සතු කිරීමේ සාධන පත්‍රයක් 18 වන වගන්තියේ විධිවිධාන යටතේ අවලංගු කිරීම හෝ අවසාන කිරීම සම්බන්ධයෙන් අධිකාරියට හෝ ඒ අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ විරුද්ධව කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

අන්සතු කිරීමේ සාධන පත්‍රයක් අවලංගු කිරීම හෝ අවසාන කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය නොහැකි බව.

## Vඅ වන කොටස

**ආණ්ඩුව විසින් අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හවුල් ව්‍යවසායක් පිළිබඳ ගිවිසුමක් අනුව ඉදිකරන ලද නිවාසවල, තට්ටු නිවාසවල සහ වෙනත් යම් ගොඩනැගිලිවල සන්තකය ආපසු ලබා ගැනීම.** [§ 3, 1988 අංක 41]

**19අ**. (අ) ආණ්ඩුව විසින් අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා 8 (ඉ) වන උපවගන්තියේ සඳහන් කර ඇති හවුල් ව්‍යවසායක් පිළිබඳ ගිවිසුමක් අනුව ක්‍රියා කරමින් ඉදි කරනු ලැබ ඇත්තා වූ ද;

(ආ) ව්‍යාපාරයක් සඳහා හෝ වාසස්ථානයක් ලෙස හෝ එසේම ගෙවල් කුලී ගෙවා හෝ නොගෙවා හෝ පදිංචිය සඳහා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ හෝ ඉන් පසුව යම් තැනැත්තකුට ලබා දෙනු ලැබ ඇත්තා වූ ද,

සෑම නිවසකට ම හෝ (1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ අර්ථානුකූලව) ලියා පදිංචි සභාධිපත්‍ය දේපළක ඒකකයකට ම හෝ (මෙහි මින් මතු "ගොඩනැගිලි" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් ගොඩනැගිල්ලකට හෝ එහි සෑම කොටසකට ම හෝ මේ කොටසේ විධිවිධාන [17] අදාළ වන්නේ ය.

මේ කොටස අදාළ වන නිවාස, තට්ටු නිවාස හෝ වෙනත් ගොඩනැගිලි. [§ 3, 1988 අංක 41]

**19ආ**. හවුල් ව්‍යවසායක් පිළිබඳ ගිවිසුමක් අනුව ක්‍රියා කරමින් සාදනු ලැබූ ගොඩනැගිල්ලක් ඉහත සඳහන් පරිදි යම් තැනැත්තකුට පදිංචිය සඳහා දෙන ලද අවස්ථාවක, එම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වන විට, මේ කොටසේ යෙදෙන "ගෙවල් හිමියා" යන යෙදුමෙන් හවුල් ව්‍යවසාය පිළිබඳ ගිවිසුමේ ප්‍රධාන විධායක නිලධාරියා ද, මේ කොටසේ "පදිංචිකරු" යන යෙදුමෙන් ඉහත කී තැනැත්තා ද අදහස් වේ.

"ගෙවල් හිමියා" සහ "පදිංචිකරු" යන යෙදුම් අර්ථ නිරූපනය කිරීම. [§ 3, 1988 අංක 41]

**19ඇ**. (1) මේ කොටස අදාළ වන යම් ගොඩනැගිල්ලක පදිංචිකරු විසින් එහි පදිංචිය නීත්‍යානුකූල ලෙස අවසන් කිරීමේ දිනයට පසුව එම පදිංචිකරුට සහ ඔහුගෙන් පැවතෙන්නන්ට සහ එම ගොඩනැගිල්ලේ පදිංචි වෙනත් සෑම තැනැත්තකුට ම ද, එම ගොඩනැගිල්ලේ (හෝ එහි යම් කොටසක) පදිංචි ව සිටීමට අයිතිවාසිකම් නොමැත්තේ ය; තව ද, ඒ අනුව ඒ ගොඩනැගිල්ලේ පදිංචිකරු එම දිනයේ දී ගොඩනැගිල්ල හිස්කර ගොඩනැගිල්ලේ සන්තකය ගොඩනැගිල්ලේ අයිතිකරුට භාර දිය යුතු අතර එම ගොඩනැගිල්ල පිහිටියේ යම් ඉඩමක හෝ

මේ කොටස අදාළ වන ගොඩනැගිල්ලක් හිස් කිරීම සම්බන්ධයෙන් වූ බැඳීම. [§ 3, 1988 අංක 41]

---

17 "මේ කොටසේ විධිවිධාන" යනුවෙන් වන වචනය මෙහි ඇතුළත් කරන ලද්දේ මේ පනත ඒකාබද්ධ කිරීමේ දී මා විසිනි. එයට හේතුව වන්නේ මේ වගන්තියෙහි අර්ථය නියමාකාරයෙන් පැහැදිලි වන්නේ එවිට වන බැවිනි. මේ වගන්තියෙහි ඉංග්‍රීසි අනුවාදය ඒ ආකාරයෙන් නිවැරදි ව සටහන් වේ.

පරිශ්‍රයක ද එම ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් තමන්ගේ පැවතෙන්නන් සහ ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ පදිංචි වෙනත් සියලු තැනැත්තන් ද සමග ඒ පදිංචිකරු ඉවත් වී යා යුතු ය.

(2) මේ කොටස අදාළ වන යම් ගොඩනැගිල්ලක් ගෙහිමියා විසින් තමා සේවයේ නියුක්ත කර තිබෙන යම් තැනැත්තකුට පදිංචිය සඳහා දෙන ලද අවස්ථාවක, එම තැනැත්තාගේ සේවා නියුක්තිය අවසන් කරනු ලැබූ දිනයේ දී, මේ කොටසේ කාර්ය සඳහා, එම ගොඩනැගිල්ලේ එම තැනැත්තාගේ පදිංචිය ද නීත්‍යානුකූලව අවසන් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කරුණු යටතේ පදිංචිකරුගේ සේවා නියුක්තිය දැනුම් දීමක් නොමැති ව අවසන් කරනු ලැබූ අවස්ථාවක, ඔහුගේ සේවා නියුක්තිය අවසන් කරනු ලැබූ දිනය පිළිබඳව එම උපවගන්තියේ කර ඇති සඳහන් කිරීම, සේවය අවසන් කිරීමේ නියම දිනයට දින දහහතරකට පසුව වූ දිනය පිළිබඳව කරනු ලබන සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

සන්තකය ආපසු ලබාගැනීම සහ නයිසයි ආඥාව භාරදීම සඳහා අධිකරණයට ඉල්ලුම් කිරීම. [§ 3, 1988 අංක 41]

**19ඈ.** (1) මේ කොටස අදාළ වන යම් ගොඩනැගිල්ලක පදිංචිකරු 19ඇ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර නොමැති අවස්ථාවක, ගොඩනැගිල්ලේ සන්තකය ආපසුලබා ගැනීම සඳහා ද පදිංචිකරු සහ ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ හෝ පරිශ්‍රයේ හෝ එහි යම් කොටසක පදිංචිව සිටින ඔහුගේ යැපෙන්නන් සහ වෙනත් යම් තැනැත්තකු එම ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් හෝ කොටසෙන් නෙරපීම සඳහා ද අයැදින ඉල්ලීමක් ගෙහිමියා විසින් ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ යම් මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාශයක ද, ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල වන අතර එවැනි සෑම ඉල්ලීමක් ම, පදිංචිකරුගේ පදිංචිය අවසන් කරන ලද කාලය සහ ආකාරය දක්වන දිවුරුම් ප්‍රකාශයක් ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, ඉල්ලීමේ පිටපතක් සහ දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් ද-

(අ) නයිසයි ආඥාව භාර දෙන ලද දිනයට පසුව එක් ලිත් මාසයක් නොඉක්මවන පරිදි, එකී ආඥාවේ සඳහන් කරනු ලබන දිනයක අධිකරණයේ පෙනී සිටින ලෙස පදිංචිකරුට නියම කරමින්; සහ

(ආ) 19ඇ වන වගනන්තිය මගින් නියම කර ඇති පරිදි තමා විසින් ගොඩනැගිල්ලේ සන්තකය භාර දී, ඒ ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩමේ හෝ පරිශ්‍රයේ හෝ එහි යම් කොටසක පදිංචිව සිටින තමාගේ පැවතෙන්නන් සහ වෙනත් සම තැනැත්තකු ම සමග ඒ ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් ඉවත් වී නොයාමට හේතු තිබේ නම් ඒ හේතු ඉදිරිපත් කරන ලෙස පදිංචිකරුට නියම කරමින් නයිසයි ආඥාවක් ද ඔහුට භාර දීමට අධිකරණය විසින් සැලැස්විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ නයිසයි ආඥාවක් පිස්කල්වරයා විසින් හෝ පිස්කල්වරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ පදිංචිකරුට ගෙන ගොස් භාර දෙනු ලැබිණි නම් හෝ එය එසේ ගෙන ගොස් භාරදෙනු ලැබිය නොහැකි වන අවස්ථාවක දී, පිස්කල්වරයා විසින් හෝ ඉහත කී බලය දෙන ලද තැනැත්තා විසින් ඒ ආඥාව අදාළ වන ගොඩනැගිල්ලේ ප්‍රකටව පෙනෙන යම් කොටසක අලවනු ලැබුවහොත් එම ආඥාව පදිංචිකරුට භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු විභාගය අඩාලව කල් තැබීම.
[§ 3, 1988 අංක 41]

**19ඉ**. (1) මේ කොටස යටතේ නයිසයි ආඥාවක් භාරදෙනු ලැබූ යම් පදිංචිකරුවකු ආඥාවේ සඳහන් කර ඇති දිනයේ දී පෙනී සිට, දිවුරුම් ප්‍රකාශයක් මගින් හෝ දිවුරුමක් පිට කරන ලද ප්‍රකාශයක් හෝ ප්‍රතිඥාවක් මගින් යම් විත්තිවාචකයක් ඉදිරිපත් කළහොත් සහ ඒ අනුව විභාගය අඩාලව කල් තැබීම අවශ්‍ය බව අධිකරණය අදහස් කළහොත්, ඉදිරිපත් කරන ලද විසඳිය යුතු කරුණ හෝ කරුණු ගැන අධිකරණය විසින් වහාම තීරණයක් කර වාර්තාගත කළ යුතු අතර, නඩුවේ අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිල්ල ඇතිව, සාක්ෂි විභාග කිරීම සඳහා හැකිතාක් ඉක්මණින් දිනයක් ද නියම කළ යුතු ය; තව ද එවිට ඒ නඩුව සඳහා කැඳවනු ලබන ලෙස පාර්ශවකරුවන් ඉල්ලා සිටින සෑම සාක්ෂිකරුවකුට ම සිතාසියක් නිකුත් කරමින් එහි සඳහන් වේලාවේ දී, එහි සඳහන් ස්ථානයට පැමිණෙන ලෙස නියම කරමින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සාක්ෂි කරුට නියම කළ හැකි ය.

(2) යම් නඩුවක් විභාග කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ යම් දිනයක් නියම කරනු ලැබූ අවස්ථාවක-

(අ) නඩුවට සම්බන්ධ සියලු පාර්ශවකරුවන් එකී අඩාලව කල් තැබීමට කැමති නම් මිස; හෝ

(ආ) පදිංචිකරු හෝ නඩුවට වැදගත් වන සිද්ධිමය කරුණු දන්නා සහ එම කරුණු ඔප්පු කිරීමට හැකි සාක්ෂිකරුවකු අපසහායකත්වයෙන් නොවන වෙනත් හේතුවක් නිසා නොපැමිණ ඇති බැවින් එකී අඩාලව කල් තැබීම අවශ්‍ය වන බවට දිවුරුම් දීමක් හෝ ප්‍රතිඥාවක් මත ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව හෝ දිවුරුම් ප්‍රකාශයකින් දෙන ලද සාක්ෂි අනුව අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස

නඩු විභාගය නැවතත් තවත් දිනයකට අඩාලව කල් තබනු නොලැබිය යුතු ය.

(3) නඩුව විභාග කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබූ දිනයේ දී හෝ (2) වන උපවගන්තිය යටතේ නඩුව විභාග කිරීම වෙනත් යම් දිනයකට අඩාලව කල් තබනු ලැබූ විටක, එකී වෙනත් දිනයේ දී, ආඥාඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වී තිබුන ද, ඉදිරිපත් කරන ලද විසඳිය යුතු ප්‍රශ්න අධිකරණය විසින් විභාග කොට, තීරණය කර, ඒවා මත නඩුව තීන්දු කළ යුතු ය.

සන්තකය භාරදීම සඳහා රිට් ආඥාවක් නිකුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
[§ 3, 1988 අංක 41]

**19ඊ**. මේ කොටස යටතේ නයිසයි ආඥාවක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකු, එම ආඥාවේ සඳහන් දිනයේ දී හෝ මේ කොටස යටතේ නඩු විභාගය වෙනත් යම් දිනයකට අඩාලව කල් තබනු ලැබූ විටක, එකී වෙනත් දිනයේ දී, අධිකරණයේ පෙනී නොසිටිය හොත් හෝ එසේ අධිකරණයේ පෙනී සිට 19ඇ වන වගන්තියෙන් නියම කර ඇති පරිදි, ආඥාවේ සඳහන් ගොඩනැගිල්ලේ සන්තකය ඔහු විසින් භාර දී, ඒ ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ හෝ පරිශ්‍රයේ හෝ එහි යම් කොටසක පදිංචි ඔහුගෙන් පැවතෙන්නන් සහ වෙනත් යම් තැනැත්තන් ද සමග, ඒ ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් ඉවත් වී නොයමට තරම් මනා සහ පිළිගත හැකි හේතු පෙන්වීමට අසමත් වුවහොත් නම්; 19ඉ (3) වන වගන්තිය යටතේ අධිකරණය විසින් පදිංචිකරුට විරුද්ධව නඩු තීන්දුවක් කර ඇති අවස්ථාවක හෝ නයිසයි ආඥාව නියත ආඥාවක් බවට පත් කළ යුතු අතර, අධිකරණය විසින් සන්තකය පිළිබඳ රිට් ආඥාවක් පිස්කල්වරයා වෙත වහාම නිකුත් කළ යුතු ය. තව ද, ඒ රිට් ආඥාව නිකුත් කිරීමේ දිනයට ලිත් මාස දෙකකට කලින් නොවන්නා වූ ද ලිත් මාස දෙකකට වඩා පසුව නොවන්නා වූ ද, රිට් ආඥාවේ සඳහන් දිනයක දී ගෙවල්

හිමියාට හෝ තත් කාර්යය සඳහා ගෙවල් හිමියා විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකුට ගොඩනැගිල්ලේ සන්තකය භාර දෙන ලෙස සහ ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් පදිංචිකරු ද, ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ හෝ එහි යම් කොටසක පදිංචි ඔහුගේ පැවතෙන්නන් සහ වෙනත් යම් තැනැත්තන් ද ඉන් නෙරපන ලෙස පිස්කල්වරයාට නියම කිරීම සහ ඒ සඳහා බලය පැවරීම කළ යුතු ය;

එසේ වුව ද, මෙහි මින් මතු විස්තර කරනු ලබන යම් සාධාරණ හේතුවක් නිසා රිට් ආඥාව නිකුත් කිරීම කල් තැබීම යෝග්‍ය බවට අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක, අධිකරණය විසින් තත් කාර්යය සඳහා නියම කරනු ලැබූ දිනයකට පෙර ඒ ගොඩනැගිල්ල එහි පදිංචිකරු විසින් භාරදෙනු ලැබීම සහ ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් පදිංචිකරු ද, එකී ඉඩමේ හෝ පරිශ්‍රයේ හෝ එහි යම් කොටසක පදිංචි ඔහුගේ පැවතෙන්නන් සහ වෙනත් යම් තැනැත්තන් ද ඉන් ඉවත් වී යාම පැහැර හැරියහොත් හැර එම රිට් ආඥාව නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) ඉහතින් ම වූ අතුරු වගන්තියෙහි "සාධාරණ හේතුව" යන්නෙන්-

(අ) පදිංචිකරුගේ හෝ ඔහුගේ යම් පැවතෙන්නකුගේ අසනීපයක්; හෝ

(ආ) 19ඇ වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක ගෙවල් හිමියාගෙන් සේවායෝජකයකුගේ තත්ත්වයෙන් යම් ලිඛිත නීතියක් යටතේ ලැබීමට පදිංචිකරුට අයිතිවාසිකම් තිබෙන යම් වේතනයක් ඔහුට ගෙවීමට හෝ එවැනි යම් ප්‍රතිලාභ හෝ වරප්‍රසාද ඔහුට දීමට හෝ ගෙවල් හිමියා අසමත් වීම; හෝ

(ඇ) පදිංචිකරුට නිසි පරිදි දිය යුතුව තිබූ යම් නිදහස් කිරීමේ සහතිකයක් හෝ හඳුනා ගැනීමේ සහතිකයක් පදිංචිකරුට දීමට ගෙවල් හිමියාගේ තත්ත්වයෙන් ඔහු අසමත් වීම; හෝ

(ඇ) යම් නිශ්චිත ගෙවීම් ගණනක් කිරීමෙන් පසුව පදිංචිකරුට අයිතිකරු වීමට හැකි වන නියමයන් මත, ගොඩනැගිල්ල පදිංචිය සඳහා ලබා දී ඇති අවස්ථාවක ඔහුගේ පදිංචිය අවසන් කරනු ලැබූ විට, යම් මුදලක් ආපසු ගෙවීම සඳහා, ගෙවල් හිමියා සහ පදිංචිකරු අතර ගිවිසුමේ විධිවිධාන සලසා ඇති විටක, ඒ මුදල ආපසු ගෙවීමට ගෙවල් හිමියා අසමත් වීම.

**19උ.** (1) ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු කුලිය වෙනත් මුදලක් ගෙවීම පදිංචිකරු පැහැර හැර ඇති අවස්ථාවක, අයවිය යුතු කුලියේ හෝ වෙනත් මුදලේ ප්‍රමාණය සහ පදිංචිකරුගේ නම සහ පදිංචි ස්ථානයේ ලිපිනය ද සඳහන් කරන ලද සහතිකයක්, ගොඩනැගිල්ල පිහිටි මහේස්ත්‍රාත් කොට්ඨාශයේ මහේස්ත්‍රාත්වරයා වෙත යැවිය හැකි ය. එවිට ගෙවල් කුලිය හෝ වෙනත් මුදලක් වශයෙන් ගෙවිය යුතු ප්‍රමාණය ඔහුගෙන් අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව වැඩි දුර කටයුතු නොකිරීමට හේතු තිබේ නම්, ඒ හේතු දක්වන ලෙස දන්වා මහේස්ත්‍රාත්වරයා විසින් පදිංචිකරු තමන් ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු පෙන්වීම පැහැර හැරියහොත් අයවිය යුතු කුලිය හෝ වෙනත් මුදල, බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වූ ද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වූ ද වරදක් සඳහා කරන ලද මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, එවිට එවැනි වරදක්

කුලී අයකර ගැනීම.
[§ 3, 1988 අංක 41]

සඳහා දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ [18] 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන [19] (එහි (ආ), (ඇ) සහ (එ) යන ඡේද හැර) අදාළ විය යුතු අතර එම දණ්ඩන නියමය කරනු ලබන අවස්ථාවේ දී මහේස්ත්‍රාත්වරයා විසින් එම උපවගන්තියේ විධිවිධාන යටතේ කළ හැකිව තිබූ යම් විධානයක් ද කළ හැකි ය.

(2) ගෙවල් හිමියාගේ සහතිකයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණය, ගොඩනැගිල්ල සඳහා වූ කුලිය හෝ වෙනත් ගෙවීමක් ලෙස අයවිය යුතු බවට සහතිකය මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

(3) මේ වගන්තිය යටතේ අධිකරණය විසින් අයකරගනු ලබන සෑම මුදලක් ම ගෙවල් හිමියාට ගෙවනු ලැබිය යුතු ය.

(4) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) දක්වා වූ උපවගන්තිවල **** සඳහන් කිසිවක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කිසිම අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය අනුව පදිංචිකරු වෙත පනවනු ලැබ ඇති බවට අදහස් කරනු ලබන දඩයක් ගෙවීම පැහැර හැරීම නිසා, එකී (1) වන උපවගන්තියේ සඳහන් පරිදි බන්ධනාගාරගත කිරීමට නියම කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් එම දඩ මුදල ගෙවීම සඳහා තවත් කාලය දීම හෝ එම මුදල කොටස්වලින් ගෙවීමට විධාන කිරීම හෝ කළ හැකි ය.

(6) එම දඩය කොටස්වලින් ගෙවන ලෙස (5) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් නියම කරනු ලැබූ සහ ඒ කොටස්වලින් එක් කොටසක් හෝ ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, එතෙක් නොගෙවා ඇති සියලුම කොටස් ගෙවීම පැහැර හැර ඇති විටක මෙන් නඩු කටයුතු පවරනු ලැබිය යුතු ය.

(7) කුලිය වශයෙන් හෝ වෙනත් මුදලක් වශයෙන් අයවිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා නඩුවක් ගෙවල් හිමියා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ පවරනු ලැබිය හැකි අතරවෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව තිබුන ද, ගෙවල් හිමියා විසින් හෝ එකී වෙනත් තැනැත්තා විසින් හෝ එම නඩු කටයුතු පවත්වාගෙන ගිය හැකි ය.

**19ඌ.** (1) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 19ඉ (3) වගන්තිය හෝ 19ඊ (1) වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම ආඥාවේ දින සිට දින දහහතරක කාලයක් ඉකුත් වීමට පෙර, එම ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

අභියාචනා.
[§ 3, 1988 අංක 41]

(2) මේ වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීමේ දී සහ විභාග කිරීමේ දී 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 321, 322 (1), 322 (2), 325, 326, 328 (ඇ), 329 සහ 330 වන වගන්ති [20] අවශ්‍ය වෙනස් කිරීම් සහිත,ව අදාළ වන්නේ ය.

---

[18] මුල් පනතේ මෙය සඳහන් වන්නේ "සිවිල් නඩු විධාන සංග්‍රහය පනත" යනුවෙනි. එය "අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යනුවෙන් නිවැරදි විය යුතු ය.

[19] 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තිය, ඇමුණුම 02 හි සටහන් අංක 08 යටතේ දක්වා ඇත.

[20] 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ මේ වගන්ති, ඇමුණුම 02 හි සටහන් අංක 09 යටතේ දක්වා ඇත.

**19එ**. මේ කොටස අදාළ වන ගොඩනැගිල්ලක සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හෝ ඒ ගොඩනැගිල්ල පිහිටා තිබෙන ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් පදිංචිකරු නෙරපීම සඳහා වූ කිසිම නඩුවක්, මේ කොටසේ විධිවිධාන යටතේ හැර, පවරනු නොලැබිය යුතු ය.

මේ කොටස අදාළ වන ගොඩනැගිලිවලින් නෙරපීම සඳහා වූ සියලුම නඩු සඳහා පමණක් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු බව.
[§ 3, 1988 අංක 41]

**19ඒ**. මේ කොටස යටතේ වූ නඩු කටයුතු සම්බන්ධයෙන් 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන සහ වියදම් සහ ගාස්තු සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා මේ කොටස යටතේ නඩුවක් රුපියල් පනහක වටිනාකම ඇති මුදල් සම්බන්ධයෙන් වූ නඩුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර 19ඇ වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක්, එම වටිනාකම ඇති ණය මුදලක් අයකර ගැනීම සඳහා වූ සිවිල් නඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මුද්දර ගාස්තු.
[§ 3, 1988 අංක 41]

**19ඔ**. ආණ්ඩුව විසින් අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරගෙන යාමේ කාර්ය සඳහා, සහතිකයේ සඳහන් තැනැත්තා සමගඅධිකාරිය හවුල් ව්‍යවසායක් පිළිබඳ ගිවිසුමකට ඇතුළත් වී ඇති බවට සහ සහතිකයේ සඳහන් ගොඩනැගිල්ල එකී තැනැත්තා විසින් එකී ගිවිසුම අනුව ක්‍රියා කරමින් ඉදිකරන ලද බවට සඳහන් කරමින් සහ එකී හවුල් ව්‍යවසායේ ප්‍රධාන විධායක නිලධාරියාගේ නම සඳහන් කරමින් අධිකාරියේ සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක්, මේ කොටස යටතේ වූ යම් නඩුවක දී සාක්ෂි වශයෙන් පිළිගත විය හැකි විය යුතු අතර එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් එය බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

අධිකාරියේ සභාපතිවරයාගේ සහතිකය.
[§ 3, 1988 අංක 41]

## VI වන කොටස

### පොදු කරුණු.

**20**. (1) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යය ඉටු කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත කලින් කල පොදු හෝ විශේෂ විධාන කරනු ලැබිය හැකි අතර අධිකාරිය විසින් ඒ විධාන ඉටු කළ යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

(2) අධිකාරියේ දේපළ, කටයුතු සහ ක්‍රියා සම්බන්ධයෙන් තමාට අවශ්‍ය වන තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කල ලියවිල්ලකින් විධාන කළ හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක් ම ඉටු කළ යුතු ය.

**21**. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. [21]

නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට

---

21 1986 මාර්තු මස 10 වන දින, අංක 392 / 9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1986 නාගරික සංවර්ධන අධිකාරිය (සැලසුම් හා ගොඩනැගිලි) නියෝග බලන්න.

හානියක් නොවන පරිදි, එය අනුමත කරනු නො ලැබූ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ දිනය ලෙස සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීමේ බලය.

**22**. අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ යම් යුක්තිසහගත වේලාවක දී යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු වී, අධිකාරියේ යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා හෝ අධිකාරියේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ යම් කටයුත්තක් කිරීමට මූලික වූ හෝ ආනුෂංගික වූ යම් සමීක්ෂණයක්, පරීක්ෂණයක් හෝ විමර්ශනයක් කිරීමේ කාර්යය සඳහා යුක්තිසහගත ලෙස අවශ්‍ය ක්‍රියා කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

සංවර්ධන ප්‍රදේශ තුළ නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත සහ වෙනත් ප්‍රඥප්ති අදාළ කිරීම.
[§ 5, 1982 අංක 4]

**23**. (1) යම් ප්‍රදේශයක් සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ වූ යම් සංවර්ධන සැලැස්ම හෝ සංවර්ධන යෝජනා ක්‍රමය හා නොගැලපෙන, නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ විධිවිධාන යටතේ වූ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ වූ යම් සංවර්ධන ප්‍රදේශයක සැලසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් ඒ ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීම නතර විය යුතු යයි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමයක් බලාත්විතව පවත්නා තාක්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඒ ප්‍රදේශය භෞතික වශයෙන් සැලසුම් කිරීම පිළිබඳව අධිකාරිය විසින් වගකිව යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි කවර විධිවිධානයක් ඇතුළත් ව ඇත ද, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චය කරනු ලබන දිනයක සිට ඒ ප්‍රදේශය භෞතික වශයෙන් සැලසුම් කිරීම සඳහා ඒ අධිකාරිය වගකිව යුතු අධිකාරිය වීම අවසන් විය යුතු යයි සහ නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන අදාළ විය යුතු යයි අධිකාරියේ ඉල්ලීම පරිදි, කලින් කල, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(4) 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ යම් ප්‍රදේශයක් තුළ, සැලසුම් කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ යම් බලයක් ක්‍රියාත්මක කිරීම, කාර්යයක් ඉටු කිරීම හෝ කටයුත්තක් කිරීම [22] (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, අධිකාරිය හැර වෙනත් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය. [§ 5, 1982 අංක 4]

(5) 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත සැලසුම් කිරීමට අදාළ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් අධිකාරිය විසින් පළාත් පාලන ආයතනයක් විමසා ඒ පළාත් පාලන ආයතනයෙහි යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි අතර, එම නිලධාරියා විසින්, අධිකාරියෙහි විධානය, අධීක්ෂණය සහ පාලනය යටතේ එසේ පවරන ලද [§ 5, 1982 අංක 4]

---

[22] 23 (4) උපවගන්තියට මේ ස්ථානයේ සිට කරන ලද සංශෝධනය 1978 ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. (1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 11 වන වගන්තිය)

බලතල ක්‍රියාවේ යෙදවීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම කරනු ලැබිය යුතු ය. [23]

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය නිලධාරීන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**24**. අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**25**. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීම.

**26**. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නො පැවරිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවනු ලබන හෝ අධිකාරිය විසින් අය කර ගනු ලබන යම් ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බව අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් බලතල යනාදිය පැවරීම.
[§ 6, 1982 අංක 4]

**26අ**. මේ පනත යටතේ අධිකාරියෙහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අධිකාරිය විසින්, අධිකාරියෙහි සභාපතිවරයා වෙත හෝ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

දඩ මුදල් අයකර ගනු ලැබූ විට, අධිකාරියෙහි අරමුදලට බැර කළ යුතු බව.
[§ 6, 1982 අංක 4]

**26ආ**. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ යම් වරදක් සඳහා නියම කරන ලද සියලු දඩ මුදල් අය කරනු ලැබූ විට, ඒවා අධිකාරියේ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

---

[23] 23 වන වගන්තියට (5) වන උපවගන්තිය එකතු කරමින් කරන ලද මේ සංශෝධනය 1978 ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. (1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 11 වන වගන්තිය)

**27**. (1) රීති සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබ ඇති හෝ නියම කරනු ලැබ ඇති සියලු කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

රීති සෑදීමට අධිකාරිය සතු බලය.

(2) මේ පනත යටතේ අධිකාරිය විසින් සාදනු ලබන කිසිම රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් බල නො පැවැත්විය යුතු ය.

**28**. (1) මේ පනතෙහි යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් හෝ කරන ලද විධානයක් හෝ නියමයක් කඩ කරන නැතහොත් ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

වැරදි සහ දණ්ඩන.
[§ 7, 1982 අංක 4]

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම මේ වගන්තිය යටතේ නියම කරන ලද දඩයකට අතිරේකව, වරදකරු කිරීමෙන් පසුව වරද කරගෙන යන්නා වූ එක් එක් දිනය සඳහා රුපියල් එක් දහසක දඩයකට ද යටත් විය යුතු ය.

**28අ**. (1) යම් සංවර්ධන ප්‍රදේශයක යම් සංවර්ධන කටයුත්තක් අවසර පත්‍රයක් නොමැතිව හෝ එම සංවර්ධන කටයුත්ත වෙනුවෙන් නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි දක්වා ඇති යම් නියම හෝ කොන්දේසිවලට පටහැනිව ආරම්භ කරන, පවත්වාගෙන යන, නැවත ආරම්භ කරන හෝ සම්පූර්ණ කරන අවස්ථාවක, මේ පනත යටතේ අධිකාරිය සතු වෙනත් යම් ප්‍රතිකර්මයකට අතිරේකව, එම සංවර්ධන කටයුත්ත කරගෙන යන්නා වූ හෝ කරගෙන ගිය හෝ කරගෙන යාමට සැලැස් වූ තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම දැන්වීමේ දින සිට දින හතකට පෙර නොවන දිනයක් විය යුතු, එම දැන්වීමේ සඳහන් දිනයක හෝ එදිනට පෙර-

අවසර පත්‍රයෙහි නියම සහ කොන්දේසිවලට පටහැනිව ආරම්භ කරන ලද ඇතැම් සංවර්ධන කටයුතු යනාදිය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.
[§ 8, 1982 අංක 4]

(අ) ඒ සංවර්ධන කටයුත්ත නොපමාව ම නතර කරන ලෙස;

(ආ) එම සංවර්ධන කටයුත්ත කරගෙන යන්නා වූ හෝ කරගෙන ගිය ඉඩම, එය මුලින් තිබුණ තත්ත්වයට නැවත පත් කරන ලෙස; හෝ

(ඇ) එම සංවර්ධන කටයුත්ත කරගෙන යනු ලබන්නේ හෝ සංවර්ධන කටයුත්තෙහි නිරතව සිටින්නේ යම් අවසර පත්‍රයක බලය යටතේ ද ඒ අවසර පත්‍රයට හෝ ඒ අවසර පත්‍රයේ යම් නියමයකට හෝ කොන්දේසියකට හෝ අනුව කටයුතු කරන ලෙස

අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි අතර, ඉහත සඳහන් නියමයන් අනුව කටයුතු කිරීමේ කාර්ය සඳහා-

(i) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම අවසන් කිරීම; හෝ

(ii) යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්තයක් කඩා දැමීම හෝ වෙනස් කිරීම

අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබූ තැනැත්තකු විසින් ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත දී හෝ කාලය දීර්ඝ කිරීම සඳහා කරනු ලැබූ ඉල්ලීමක් මත, අධිකාරිය විසින් දීර්ඝ කරන ලද යම් කාලසීමාවක් ඇතුළත දී ඒ දැන්වීමේ සඳහන් යම් නියම අනුව ක්‍රියා කිරීම ඔහුගේ කාර්යය විය යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් ලිඛිත දැන්වීමක සඳහන් කාලය ඇතුළත හෝ අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලබන යම් දීර්ඝ කරන ලද කාලයක් ඇතුළත හෝ ඒ ලිඛිත දැන්වීමෙහි ඇතුළත් යම් නියමයක් අනුව කටයුතු කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක- [§ 8, 1984 අංක 44]

(අ) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම අත්හැර දැමීමට;

(ආ) යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්තයක් කඩා දැමීමට හෝ වෙනස් කිරීමට;

(ඇ) අවස්ථාවෝචිත පරිදි ඒ දැන්වීමෙන් ඒ තැනැත්තාට කරනු ලැබීමට නියමිත වෙනත් එවැනි සියලු ක්‍රියා කිරීමට,

අධිකාරියට බලය දෙමින් ආඥාවක් කරන ලෙස පෙත්සමක සහ දිවුරුම් පත්‍රයක මාර්ගයෙන් අධිකාරිය විසින් මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. තව ද මහේස්ත්‍රාත්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ නියමයන් අනුව කටයුතු කිරීම පැහැර හැර ඇති තැනැත්තා වෙත දැන්වීමක් භාර දීමෙන් පසුව, ඒ බවට මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඒ අනුව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(ආ) 28අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් පරිදි, ඉඩම හෝ ගොඩනැගිල්ල පාවිච්චි කිරීම අත්හැර දැමීමට හෝ ගොඩනැගිල්ල හෝ කර්මාන්තය කඩා දැමීමට හෝ වෙනස් කිරීමට නැතහොත් එකී ඡේදයේ සඳහන් වෙනත් ක්‍රියා කිරීමට හෝ ඒ තැනැත්තා පොරොන්දු වන්නේ නම්, සුදුසු යයි මහේස්ත්‍රාත්වරයා විසින් කල්පනා කරනු ලබතහොත් ඒ නියමය අනුව කටයුතු කිරීමේ අවස්ථාවක් ඒ තැනැත්තාට ලබා දීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් යයි ඔහු විසින් කල්පනා කරනු ලබන පරිදි මාස දෙකක් නොඉක්මවන කාලයකට ආඥාව ක්‍රියාත්මක වීම, මහේස්ත්‍රාත්වරයා විසින් කල් තබනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අධිකරණ ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, එම ආඥාව ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු සහාය අධිකාරිය වෙත දීම පොලීසියේ කාර්යය විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද ආඥාවක් ප්‍රකාර යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්තයක් කඩා දැමීමේ දී හෝ වෙනස් කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් සාධාරන වියදමක් අයකර ගැනීමේ හිමිකම අධිකාරියට තිබිය යුතු ය.

(6) ඒ දැන්වීම අනුව කටයුතු කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබීම හේතුවෙන්, ඔහු විසින් දරන ලද යම් බැරකමක් සම්බන්ධයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන බල නොපෑ යුතු ය. [§ 8, 1984 අංක 44]

ඇතැම් අවස්ථාවල දී ඉඩම් සතුකර ගැනීම.

[§ 8, 1982 අංක 4]

**28ආ.** (1) යම් තැනැත්තකු, -

(අ) 8එ (1) වන වගන්තියේ යම් විධිවිධානයක් කඩ කර තිබීම නිසා 28 වන වගන්තිය යටතේ වරදකරු කරනු ලැබ ඇත්තා වූ ද;

(ආ) 28අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබ තිබිය දී ඒ දැන්වීමෙහි යම් නියම අනුව ක්‍රියා කොට නොමැත්තා වූ ද,

කවර හෝ විටෙක, අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනු ලැබ, ඉඩම හෝ ගොඩනැගිල්ල, පවත්නා තත්ත්වයෙන් යම් කාර්යයක් සඳහා අධිකාරිය විසින් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ විට, ඔහු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු දිනයක සිට, එම ඉඩම අධිකාරිය වෙත සතු කරනු ලැබිය හැකි ය.

(2) යම් ඉඩමක් (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත සතු කරනු ලැබ ඇති අවස්ථාවක-

(අ) එම ඉඩමෙහි යම් සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා 8එ වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් ලබාගෙන නොමැති අවස්ථාවක, එවැනි යම් සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු ය.

(ආ) ඒ ඉඩමෙහි සංවර්ධන කටයුතු කිසිවක් කරගෙන යාම සඳහා 8එ වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් ලබාගෙන ඇති අවස්ථාවක, එම අවසර පත්‍රයෙහි දක්වා ඇති නියම හා කොන්දේසි අනුව කරගෙන ගොස් ඇති වැඩ ප්‍රමාණයට හැර, එම සංවර්ධන කටයුත්ත වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු ය.

**28ඇ.** තැනැත්තන් මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කරන ලද අවස්ථාවක - පුද්ගල මණ්ඩල යනාදිය විසින් කරනු ලබන වැරදි.

(i) ඒ මණ්ඩලය (රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් නොවන) සංස්ථාගත මණ්ඩලයක් නම්, වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ව හෝ ලේකම්වරයකු හෝ වෙනත් වෙනත් සමාන නිලධරයකු ව සිටි සෑම තැනැත්තකු ම; හෝ [§ 8, 1982 අංක 4] [§ 16, 2000 අංක 49]

(ii) ඒ මණ්ඩලය රාජ්‍ය සංස්ථාවක් නම්, එහි සභාපතිවරයා හෝ සභාපතිවරයකු නො සිටින අවස්ථාවක, එහි ප්‍රධාන විධායක නිලධාරියා; හෝ

(iii) ඒ මණ්ඩලය පළාත් පාලන ආයතනයක් නම්, එය සංවර්ධන සභාවක් වන අවස්ථාවක, එහි දිසා ලේකම්වරයා හෝ එය මහා නගර සභාවක් හෝ නගර සභාවක් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා; හෝ

(iv) ඒ මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නොවේ නම්, වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ සාමාජිකයකු ව හෝ [§ 16, 2000 අංක 49]

හවුල්කරුවකු ව හෝ එහි ප්‍රධාන විධායක නිලධාරියා ව සිටි සෑම තැනැත්තකු ම; [24], [25]

ස්වකීය කැමැත්ත හෝ අනුදැනීම හෝ නොමැතිව ඒ වරද කරන ලද බව ස්වකීය කර්තව්‍යයෙහි ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, ඒ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව ද ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරද කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

ආඥාවක් සඳහා වූ ඉල්ලීම දෙනු ලබන කාලයක් ඇතුළත බැහැර කළ යුතු බව. [§ 9, 1984 අංක 44]

**28ඇ**. 28අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ආඥාවක් සඳහා කරන ලද සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් ම, ඒ ඉල්ලීමේ දින සිට දින හැටක කාලයක් ඇතුළත අවසානාත්මක වශයෙන් බැහැර කරනු ලැබිය යුතු ය.

තව ද-

(අ) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම අත්හැර දැමීමට; හෝ

(ආ) යම් ගොඩනැගිල්ලක් හෝ කර්මාන්තයක් කඩා දැමීමට; හෝ

(ඇ) 28අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් වෙනත් එවැනි ක්‍රියා කිරීමට,

අධිකාරියට බලය දෙමින් යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කරමින් මහේස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලබන අවස්ථාවක, ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දින සිට දින අනූවක කාලයක් ඇතුළත ඒ ආඥාව අනුව කටයුතු කිරීමට සැලැස්වීම සඳහා අවශ්‍ය සියලු ආඥා මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**29**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් සංවර්ධන සභාවක්, [26] මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් [27] අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ; තවද [§ 9, 1982 අංක 4]

"සංවර්ධන කටයුත්ත" යන්නෙන්, යම් ඉඩමක් කොටස් කිරීම හෝ අනු කොටස්වලට බෙදීම, ඒ මත ඉදිකිරීම් තැනීම හෝ නැවත තැනීම සහ කර්මාන්ත ඉදි කිරීම, එම ඉඩමෙහි, ඉඩම මත හෝ ඉඩම යට ගොඩනැගිලි, ඉංජිනේරු සහ වෙනත් මෙහෙයුම් කරගෙන යාම, එම ඉඩම හෝ එහි යම් ඉදිකිරීමක් පාවිච්චි කරනු ලබන්නේ, කෘෂිකර්මයේ සහ උද්‍යාන විද්‍යාවේ කාර්ය සඳහා යම් ඉඩමක් යොදා ගැනීම සහ [§ 9, 1982 අංක 4]

---

[24] 2000 අංක 49 දරන පනතෙන් කරන ලද මේ සංශෝධනයේ ද, 1982 අංක 4 දරන පනතේ මුල් වගන්ති වැරදි ලෙස දක්වා ඇත. නිවැරදි අර්ථය මතු වන සේ 1982 අංක 4 දරන පනතේ වගන්ති එලෙස ම තබා ගනිමින් වාක්‍යය සකස් කර ඇත.

[25] 1982 අංක 4 දරන පනතේ මේ වගන්තියට අදාළ ව ඇතුළත් කර තිබූ (ආ) ඡේදය 2000 අංක 49 දරන පනතේ 16 වන වගන්තිය අනුව ඉවත් කරනු ලැබ ඇත.

[26] 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත, 1989 අංක 14 දරන සංවර්ධන සභා (ඉවත් කිරීමේ) පනත මගින් ඉවත් කර ඇත.

[27] 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 වන වගන්තියට අනුව", සුළු නගර සභාව සහ ගම් සභාව" යන්න වෙනුවට, "ප්‍රාදේශීය සභාව" වශයෙන් තේරුම් ගත යුතු ය.

පදිංචි නිවාසයක සීමාව ඇතුළත යම් ඉඩම් ප්‍රමාණයක් එම පදිංචි නිවාසය භුක්ති විඳීම ආනුෂංගික වන්නා වූ ද අලුත් ගොඩනැගිලි සැලැස්මක් ඉදිරිපත් කිරීම හෝ ඒ පදිංචි නිවාසය වෙනුවෙන් දැනටමත් අනුමත කර ඇති ගොඩනැගිලි සැලැස්මක් වෙනස් කිරීම හෝ අදාළ නොවන්නා වූ ද කාර්ය සඳහා යොදා ගැනීමක් නොවන යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යයෙහි වෙනසක් කිරීම, අදහස් වේ;

''ආණ්ඩුවේ නියෝජ්‍යායතනය'' යන්නෙන්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් අදහස් වේ; [§ 9, 1982 අංක 4]

''භෞතික සැලසුම් කිරීම'' යන්නට භෞතික වශයෙන් සහ ආර්ථික වශයෙන් ඉඩම සංවර්ධනය කිරීම ද ඇතුළත් වේ;

''රාජ්‍ය සංස්ථාව'' යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර, වෙනත් යම් කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ. [§ 9, 1982 අංක 4]

පාඨක පරිශීලනය සඳහා පමණි - ගම්මන්පිල ලේකම්

## උපලේඛනය

[§ 10, 1982 අංක 4]

8අ වන වගන්තිය

**සංවර්ධන සැලැස්මෙහි විධිවිධාන සලස්වනු ලැබිය හැකි කාරණා**

1. සංවර්ධන ප්‍රදේශයෙහි ඉඩම් සහ ගොඩනැගිලි පාවිච්චි කරනු ලැබිය හැකි ආකාරය.

2. විවිධ කාර්ය සඳහා ඉඩම් කොටස්වලට බෙදීම, වෙන්කිරීම හෝ කලාපගත කිරීම.

3. විවිධ කලාපවල ඉඩම් සහ ගොඩනැගිලි පදිංචියට ගැනීම, වාණිජ කටයුතු, කර්මාන්ත යනාදී වශයෙන් ප්‍රයෝජනයට ගැනීම විධිමත් කිරීම සඳහා ද බිම් ප්‍රමාණ අනුපාතය, ඝනත්වය, පිහිටීමේ උස, මහල් සංඛ්‍යාව සහ ගොඩනැගිලි සහ ඉදිකිරීම්වල ප්‍රමාණය, බිම් කට්ටිවල ප්‍රමාණය, අංගන සහ විවෘත ඉඩකඩ, වීදිවල සිට ඇත් විය යුතු දුර, ගොඩනැගිලි සීමා සහ ගොඩනැගිලි, ඉදිකිරීම් සහ යාබද ඉඩම් පාලනය කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් කොන්දේසි සහ සීමා පැනවීම.

4. ගොඩනැගිලි සම්බන්ධයෙන් -

(අ) ගොඩනැගිලිවල විවිධ කොටස්වල ශක්තිය, අළුත්වැඩියා කිරීම සහ අධිව්‍යුහය;

(ආ) ප්‍රමාණය සහ උස, භූමියෙහි මට්ටම, කාමර සහ පහසුකම් පිළිබඳ ප්‍රමිත, තරප්පු පේළි සහ පිටමංවල පිහිටීම සහ ප්‍රමිත;

(ඇ) ආලෝකය සහ වාතාශ්‍රය;

(ඈ) ගින්නෙන් ආරක්ෂාව;

(ඉ) වැසි ජලය එක්රැස් කිරීම සඳහා අවශ්‍ය පියවර සැලසීම සහ පරිශ්‍රයේ සහ වහලයේ ජලාපවහනය; [§ 3, 2007 අංක 36]

(ඊ) ඉදි කිරීමේ ද්‍රව්‍ය සහ භාවිත ක්‍රමය සඳහා පිරිවැය;

(උ) ජල නල යෙදීම, කැලි කසළ ඉවත් කිරීම, විදුලි රැහැන් ඇදීම, නල සහ විදුලි සෝපාන [28] සවි කිරීම සඳහා ප්‍රමිත සහ ද්‍රව්‍ය;

(ඌ) විදුලි, දුරකථන, විදුලි සංදේශ සහ මයික්‍රෝවේව් සහ වෙනත් රැහැන්වල සිට ගොඩනැගිලි දක්වා පැහැදිලි දුර පිළිබඳ විධිවිධාන;

(එ) ආරක්ෂා රහිත ගොඩනැගිලි සම්බන්ධයෙන් නියෝග සහ ගොඩනැගිලිවල ශක්තිය, ආරක්ෂාව සහ පහසුකම් තහවුරු කිරීම සඳහා ගොඩනැගිලිවල යෝග්‍යතාව සහ ආනුෂංගික වෙනත් කරුණු සම්බන්ධයෙන් ප්‍රමිත නියම කිරීම;

සඳහා නියම.

---

[28] මේ ඡේදය 1982 අංක 4 දරන පනතේ සිංහල පිටපතේ දැක්වෙන්නේ "නල විදුලි සෝපාන" යනුවෙනි. එය ඉංග්‍රීසි අනුවාදයේ එය "නල සහ විදුලි සෝපාන" යනුවෙන් නිවැරදි ව සටහන් ව ඇත. ඒ අනුව මෙහි එය නිවැරදි ව සටහන් කර ඇත.

5. ගොඩනැගිලිවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ, උස සහ ඉදිරිපස පිහිටුම පාලනය කිරීම සහ නාගරික සැලසුම් අරමුණු ඉටු කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම.

6. කැලෑ ඉඩම් සහ ගස් ආරක්ෂා කිරීම සහ වගා කිරීම ද, දර්ශනීය ස්ථාන සහ යෝජනා ක්‍රම සහ ඓතිහාසික සහ වාස්තු විද්‍යාත්මක වටිනාකමක් ඇති සහ රමණීය දර්ශනයන්ගෙන් යුත් ස්ථාන ආරක්ෂා කිරීම ද ඇතුළුව භූමි දර්ශන රැක ගැනීම සහ නංවාලීම සඳහා විධිවිධාන සැලැස්වීම.

7. පරිසර දූෂණය, පරිසරගුණය සහ දැන්වීම් පළ කිරීම පාලනය කිරීම.

8. මෝටර් රථ නතර කිරීම සඳහා ද සියලුම වර්ගවල වාහන නතර කිරීම, ඒවාට පැටවීම සහ ඒවායේ සේවා කිරීමේ ස්ථාන පිළිබඳව විධිවිධාන සැලැස්වීම.

9. (අ) පයින් ගමන් කරන්නන් සහ සයිකල් පදින්නන් සඳහා විශේෂ පහසුකම් ඇතුළත් ව වාහන සහ ගමන් පහසුකම්;

(ආ) ජල සැපයීම, කසළ බැහැර කිරීම සහ ජලාපවහනය හා කසළ ඉවත් කිරීමේ පහසුකම්;

(ඇ) විදුලි බලය සැපයීම;

(ඈ) විදුලි සංදේශ කටයුතු,

පිළිබඳ වූ ද ඊට ආනුෂංගික වන්නා වූ ද කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම.

10. ප්‍රවේශ මං සහ පාරවල්, උද්‍යාන, ක්‍රීඩා භූමි සහ වෙනත් පහසුකම් සඳහා විවෘත ඉඩකඩ සඳහා අවම ප්‍රමිත ඇතුළත් ව, ගොඩනැගිලි කාර්ය සඳහා ඉඩම් පිරිසැලසුම් කිරීම සඳහා ද, පාරවල් තැනීම හෝ පාරවල් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ඉඩම් පිළිබඳ කොන්දේසි පැනවීම සඳහා ද විධිවිධාන සැලැස්වීම සහ එවැනි පහසුකම් සැලසීම හෝ එවැනි ඉදි කිරීම් හෝ වැඩි දියුණු කිරීම් සම්බන්ධයෙන් වූ වියදමට දායක වීම.

11. ඉඩම් ගොඩ කිරීම සඳහා විධිවිධාන සැලසීම.

12. හිස්ව තිබෙන්නා වූ හෝ දැනට ම ඉදි කිරීම් කර ඇත්තා වූ ඉඩම්, ගොඩනැගිලි තැනීමේ භූමි භාග වශයෙන් පිරිසැලසුම් කිරීම සහ යළි පිරිසැලසුම් කිරීම.

13. පටු මාවත්, වීදි, පාරවල් සහ විදුලි සංදේශ කටයුතු ඉදි කිරීම, හැරවීම, දීර්ඝ කිරීම, වෙනස් කිරීම සහ වැඩි දියුණු කිරීම.

14. ගොඩනැගිලි, පාලම් සහ වෙනත් ඉදි කිරීම් තැනීම, වෙනස් කිරීම, ඉවත් කිරීම සහ කඩා දැමීම.

15. දේපළවල අයිතිකරුවන්ට හිමි භූමි කොටස්වල සීමා නැවත බෙදා වෙන් කිරීම සහ නැවත පිහිටුවීම.

16. විශේෂ සැලකිල්ල දැක්වීම සඳහා ප්‍රදේශ ප්‍රදේශ බෙදා වෙන් කිරීම සහ ඒවා විස්තර වශයෙන් සැලසුම් කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රතිසංවර්ධනය කිරීම.

17. සංවර්ධන සැලැස්ම කරගෙන යා යුතු පියවරවල්.

18. විවිධ සංවර්ධන කාර්ය වෙනුවෙන් ගාස්තු සහ සේවා ගාස්තු අය කිරීම.

ජාතික පුස්තකාල ශ්‍රී ලංකා ගාමිණී ගුණසේකර

# 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ ඇතුළත් කරුණු අතර පවතින වෙනත් නීතිවල සම්බන්ධතා සහ නීති කොටස්වල නියමයන් විස්තර කෙරෙන ඇමුණුම්

## ඇමුණුම් අංක 01

## 1984 අංක 44 දරන නාගරික සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනතේ සඳහන් විශේෂිත කරුණු ඇතුළත් ඒ පනතේ 3 වන වගන්තිය දක්වා වූ නියමයන්

**නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ කරන ලද ඇතැම් ක්‍රියා වලංගු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; නාගරික සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 1984 අංක 44 දරන නාගරික සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**I වන කොටස**

**2.** ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 1 වන වගන්තියේ ඇතුළත් විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද එකී පනත සහතික කරනු ලැබූ දිනයෙහි එකී පනතෙහි වූ විධිවිධාන 1978 සැප්තැම්බර් මස 06 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී පනත සංශෝධනය කෙරෙන යම් පනතක විධිවිධාන ඒ සංශෝධන පනතෙහි ප්‍රකාශිත විධිවිධාන කිසිවක් සලසා නොමැති නම්, ඒ පනත සහතික කරනු ලැබූ දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, ඒ පනතෙහි ප්‍රකාශිත විධිවිධාන සලසා ඇත්නම්, එහි සඳහන් දින සිට ඒ විධිවිධාන ක්‍රියාත්මක වූ සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව-

(අ) නීතියේ එවැනි යම් විධිවිධානයක් ප්‍රකාර හෝ එවැනි යම් විධිවිධානයක් ප්‍රකාර යයි සලකනු ලැබ කටයුතු කිරීමේ දී කරන ලද හෝ නොකර හරින ලද සෑම ක්‍රියාවක් සහ කරන ලද සෑම නියමයක් ම, එකී පනතේ සහ සංශෝධනවල විධිවිධාන, මෙහි මින් පෙර සඳහන් දින සිට ක්‍රියාත්මක වූ ලෙස වලංගු සහ බලසහිත වූ බවට සලකනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි විනිශ්චයට භාජනව තිබුණු හෝ අවසන් කරනු නොලැබූ සියලු නඩු, කඩු කටයුතු හෝ දේවල් මේ පනතින් සංශෝධිත එකී පනතේ සහ සංශෝධන පනත්වල විධිවිධානවලට අනුකූලව

විභාග කොට තීරණය කිරීම හෝ පවත්වා ගෙන ගොස් අවසාන කිරීම හෝ කරනු ලැබිය යුතු ය;

එසේ වුව ද මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් වූ වරදක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීම හෝ දඬුවම් කිරීම සඳහා කිසිම නඩු කටයුත්තක් මේ වගන්තියේ විධිවිධාන නිසාම ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලැබීම හෝ පවත්වාගෙන යාම හෝ කරනු නොලැබිය යුතු ය.

මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් නඩු කටයුත්තක් පැවරීම හෝ විනිශ්චයට භාජනව තිබුණු යම් නඩු කටයුත්තක් පවත්වාගෙන යාම, එකී පනතේ 28අ (3) වගන්තියේ සහ මේ පනතින් සංශෝධිත සංශෝධන පනත්වල විධිවිධාන ප්‍රකාර ව කළ හැකි බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. තව ද, ඒ අනුව මහේස්ත්‍රාත් වරයකු විසින්, එකී 28අ (3) වගන්තියෙහි සඳහන් යම් ආඥාවක් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

නිදහස් කිරීම.

**3**. නාගරික සංවර්ධන අධිකාරිය පනතේ සහ ඊට කරන ලද සංශෝධනවල විධිවිධාන ප්‍රකාර හෝ ඒ විධිවිධාන ප්‍රකාර යයි සලකනු ලැබ කටයුතු කිරීමේ දී 1978 සැප්තැම්බර් මස 06 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලය තුළ, නාගරික සංවර්ධන අධිකාරියේ යම් නිලධරයකු, සේවකයකු, හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සඳහා ඔහුට විරුද්ධව කිසිම අපරාධ හෝ සිවිල් නඩුවක් පැවරීම හෝ පවත්වා ගෙන යාම හෝ නොකරනු ලැබිය යුතු ය.

## II වන කොටස

(මේ කොටසේ ඇතුළත් සංශෝධනයන් සියල්ල ම ඒකාබද්ධ කරන ලද ලේඛනයට ඇතුළත් කරනු ලැබ ඇති අතර, මේ පනතේ 12 වන වගන්තිය ඇමුණුම 02 හි සටහන් අංක 01 ට ඇතුළත් කර ඇති බව සලකන්න)

## ඇමුණුම් අංක 02

**සටහන් අංක 01 - 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 12 වන වගන්තිය.**

පළාත් පාලන ආයතන නිලධරයන් විසින් නීත්‍යානුකූල අවසරයක් නොමැතිව කරන ලද ඇතැම් ක්‍රියා බලාන්විත කිරීම.

"**12**. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත සැලසුම් කිරීමට අදාළ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ ලා පළාත් පාලන ආයතනයක නිලධරයකු විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව යම් ක්‍රියාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමට, කිරීමට හෝ ඉටු කිරීමට ඒ නිලධරයාට නීත්‍යානුකූලව බලය පවරා නොතිබීමේ හේතුව නිසා පමණක් ඒ ක්‍රියාව අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය."

**සටහන් අංක 02 - 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 22ආ වන වගන්තිය.**

දේපළ සංවර්ධනයෙහි නිරත ව්‍යවසායන්ගේ ලාභ සහ ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

"**22ආ**. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් අත්වන ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ව ලාභ සහ ආදායම ඒ සමාගම ව්‍යාපාර කටයුතු කරගන ‍යාම ආරම්භ කරන ලද දින සිට ආගණනය කරන ලද අවුරුදු දහයක කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන-

(අ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරනු ලැබූ; සහ

(ආ) ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරන දිනයෙහි නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ නැතහොත් ව්‍යාපාර කරගෙන යාම ආරම්භ කරන ලද දින සිට අවුරුදු දෙකක් ඇතුළත නිල ලැයිස්තුගත පොදු සමාගමක් බවට පත් වන්නා වූ; සහ

(ඇ) ආණ්ඩුවේ නාගරික සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය යයි (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද) නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද දේපළ සංවර්ධන යෝජනා ක්‍රමවල හුදෙක් ම නිරත වූ,

යම් සමාගමකට අදාළ විය යුතු ය.

**සටහන් අංක 03 - 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනතේ 26 වන වගන්තියේ දැක්වෙන "හානියට පත් දේපළ" පිළිබඳ අර්ථය**

"**26**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි- අර්ථ නිරූපණය.

"හානියට පත් දේපළ" යන්නෙන්, 1983 ජුලි 24 දින හෝ එදිනට පසු සහ 1983 අගෝස්තු 8 වන දිනට පෙර කැරලි කෝලාහල හෝ ජන කැළඹීම්වලින් හානි සිදු වූ හෝ විනාශ කරන ලද යම් දේපළක් අදහස් වන අතර, කැරලි කෝලාහල හෝ ජන කැළඹීම්වලින් හානි සිදු වූ හෝ විනාශ කරන ලද දේපළ ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන වෙනත් දේපළක් ඊට ඇතුළත් වේ.

"හානියට පත් ව්‍යාපාර හෝ කර්මාන්ත" යන්නෙන්, 1983 ජුලි 24 දින හෝ එදිනට පසු සහ 1983 අගෝස්තු 8 වන දිනට පෙර කැරලි කෝලාහල හෝ ජන කැළඹීම්වලින් අලාභ හානි සිදු වූ විනාශ කරන ලද කර්මාන්ත හෝ වෙළෙඳ ස්වරූපයේ වූ යම් ව්‍යවසායක් අදහස් වන අතර, එම ව්‍යවසායේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබූ සියලු නිශ්චල සහ චංචල දේපළ එයට අයත් වේ."

**සටහන් අංක 04 - 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය.**

"**13**. (2) යම් රාජ්‍ය නිලධරයකු මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක හෝ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක-

රාජ්‍ය නිලධරයන්, පළාත් පාලන සේවයෙහි නිලධරයන්, යම් පළාත් පාලන ආයතනයක නිලධරයන්, මධ්‍යම මණ්ඩලයේ නිලධරයන් සහ ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලවල නිලධරයන් මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක කාර්ය මණ්ඩලයට පත් කිරීම.

(අ) ඔහු ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ වේලාවේ දී, රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම්-

(i) ඔහු ඒ මණ්ඩලයේ සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති අතරතුර, රාජ්‍ය ප්‍රතිපත්තිය මත විශ්‍රාම වැටුප් රහිතව දෙන ලද නිවාඩු පිට රාජ්‍ය සේවයේ රාජකාරිය සඳහා නොපැමිණි ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ

ව්‍යවස්ථා සංග්‍රහයෙහි 10 (i) වන වගන්තිය ඔහුට අදාළ විය යුතු ය; සහ

(ii) ඔහු මණ්ඩලයේ සේවයෙහි නියුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් ම සඳහා, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවනු ලැබිය යුතු වැටුපෙන් සියයට විසි පහක් නොඉක්මවන මුදලක් මණ්ඩලය විසින් ඔහු සම්බන්ධයෙන් මණ්ඩලයේ අරමුදලින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයාට ගෙවිය යුතු ය; තව ද

(ආ) ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් ඔහු පත්කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලෙහි දායකයකු ව සිටියේ නම්, ඒ මණ්ඩලයට ඔහු විසින් කරනු ලබන සේවය, ඒ ආඥාපනතේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඒ ආඥාපනත යටතේ ගෙවීමට ඔහු යටත් වන දායක මුදල් ඔහු ඒ මණ්ඩලයේ සේවයෙහි නියුක්ත කර ලැබ සිටින අතරතුර, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට නොකඩවා ගෙවිය යුතු ය. තව ද එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ඒ මණ්ඩලයේ අරමුදල්වලින් ඔහු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට ආණ්ඩුව යටත් වන දායක මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ උචිත ගිණුමට බැර කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ඒ මණ්ඩලය විසින් ඔහු සම්බන්ධ යෙන් ගෙවනු ලැබිය යුතු ය.

**සටහන් අංක 05 - 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තිය.**

"**13**. (3) යම් රාජ්‍ය නිලධරයකු මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක හෝ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක-

(ආ) ඔහු රාජ්‍ය සේවයෙන් අස් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) ඔහු ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ වේලාවේ දී, රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම්-

(i) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ දින සිට අසනීපයක් හේතු කොට ගෙන රාජ්‍ය සේවයෙන් ඔහු විශ්‍රාම ගන්වනු ලැබ තිබිණි නම් ඔහුට ගෙවනු ලැබිය හැකි ව තිබූ ප්‍රදානයක් ලැබීමට ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට සුදුසුකම් තිබිය යුතු ය;

(ii) වයස නිසා හෝ අසනීපයක් නිසා හෝ ඔහු විසින් ඒ කාර්ය මණ්ඩලයෙහි දරන ලද තනතුර අහෝසි කිරීම නිසා හෝ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවා නියුක්තිය, විශ්‍රාම ගැන්වීමෙන් අවසන් කරනු ලැබුවහොත් මිස, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරන ලද එවැනි යම් ප්‍රදානයක සඳහන් මුදල් ප්‍රමාණය ඔහුට ගෙවනු නොලැබිය යුතු ය; තව ද

(iii) ඒ මණ්ඩලයෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින අතරතුර, ඔහුගේ මරණය සිදු වූ විට, ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර ව පත්

කරනු ලැබීමට පෙරාතුව ම ඔහුගේ මරණය සිදු වී නම් ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ව තිබූ යම් ප්‍රදානයක් ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත්කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලෙහි දායකයකු ව සිටියේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇති ව, ගිවිසුම අවසන් වීමෙන් ඔහු ආණ්ඩුවේ සේවය අත් හරිනු ලැබූ ලෙස ඒ ආඥාපනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

**සටහන් අංක 06 - 460 වන අධිකාරය වූ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය සහ 38 වන වගන්තිය.**

"**7.** (1) 5 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් අත්කර ගැනීමේ නිලධාරියා විසින් මේ වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූල දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ප්‍රසිද්ධ කරවිය යුතු ය. තව ද, ඒ වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයෙහි සඳහන් ඉඩමෙහි වටිනාකම ස්වකීය මතය අනුව රුපියල් පන්සියයට වැඩි වන අවස්ථාවක ඒ දැන්වීම ලංකාවෙහි ප්‍රචාරය වන සිංහල ප්‍රවෘත්ති පත්‍රයක ද, දෙමළ ප්‍රවෘත්ති පත්‍රයක ද ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද ප්‍රසිද්ධ කරවිය යුතු අතර, ඒ දැන්වීම ඒ ඉඩමෙහි හෝ ඒ අසළ ඇතැම් ප්‍රකට ස්ථානවල ද ඒ භාෂාවලින් ප්‍රදර්ශනය කරවිය යුතු ය.

සම්බන්ධතා ඇති තැනැත්තන්ට දැන්වීම.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) අත්කර ගැනීමට අදහස් කර ඇති ඉඩම හෝ පරවශතාව විස්තර කළ යුතු ය;

(ආ) මේ පනත යටතේ ඒ ඉඩම හෝ පරවශතාව අත්කර ගැනීමට අදහස් කර තිබෙන බව ද, ඒ ඉඩම හෝ පරවශතාව පිළිබඳ වන්දි ඉල්ලීම්, දැන්වීමෙහි සඳහන් අත්කර ගැනීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු බව ද එහි සඳහන් කළ යුතු ය; තව ද

(ඇ) අත්කර ගැනීමට තිබෙන ඉඩමට හෝ අත්කර ගැනීමට තිබෙන පරවශතාව යටත් වන ඉඩමට සම්බන්ධතා ඇති සෑම තැනැත්තකු විසින් ම, (දැන්වීම පළමු වතාවට ඉඩමෙහි හෝ ඉඩම අසළ ප්‍රදර්ශනය කළ යුතු දිනයෙන් පසුව එළැඹෙන දින විසි එකකට කලින් නොවන දිනයක් වන) දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයක සහ වේලාවක දී එසේ සඳහන් ස්ථානයක දී අත්කර ගැනීමේ නිලධාරියා ඉදිරියට පෞද්ගලික ව හෝ යථා පරිදි ලියවිල්ලක් මගින් පවරනු ලැබූ නියෝජිතයකුගේ මාර්ගයෙන් පැමිණ සිටීමට සහ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයට අඩු වශයෙන් දවස් හතකට පෙර, ඉඩමෙහි තමාට ඇති සම්බන්ධතාවෙහි ස්වභාවය ද, වන්දි [1954 අංක 39, § 4] ඉල්ලීමේ විස්තර ද, වන්දි මුදලේ ප්‍රමාණය ද, ඒ මුදල ගණන් ගත් ආකාරය පිළිබඳ විස්තර ද, ඒ තැනැත්තා විසින් හෝ ඉහත කී ලෙස යථා පරිදි බලය පවරනු ලැබූ යම් නියෝජිතයකු විසින් අත්සන් කරනු ලැබූ ලියවිල්ලක් මගින් අත්කර ගැනීමේ නිලධාරියා වෙත දන්වන ලෙස එයින් නියම කළ යුතු ය.

එසේ වුව ද, ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමෙන් පසු සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරනු ලබන සෑහෙන හේතුවක් උඩ ඒ ඉඩමට සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් වන්දි ඉල්ලීම දැන්විය යුතු හා අත්කර ගැනීමේ නිලධාරියා ඉදිරියෙහි පෙනී සිටිය යුතු කාලය ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කළ දින සිට දවස් විසි අටක් දක්වා දීර්ඝ කිරීම ඒ අත්කර ගැනීමේ නිලධාරියා විසින් කළ හැකි ය.

(3) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල සඳහන් [1954 අංක 39, § 4] කිසිවක් නොතකා, ඒ විධිවිධාන මගින් ප්‍රවෘත්ති පත්‍රවල පළ කිරීමට නියම වූ යම් දැන්වීමක, අත්කර ගැනීමට අදහස් කරනු ලැබූ ඉඩම හෝ පරවශතාව පමණක් වුව ද, සඳහන් කොට ඒ අත්කර ගැනීම සම්බන්ධ වැඩි විස්තර දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් විය හැකි ගැසට් පත්‍රයෙන් බලා ගන්නා ලෙස සඳහන් කළ හැකි ය.

(4) යම් ඉඩමක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ දැන්වීමක් ප්‍රසිද්ධ කරවන අත්කර ගැනීමේ නිලධාරියා, ඒ ඉඩම පිළිබඳ සම්බන්ධතා ඇති යම් තැනැත්තකු බාල වයස්කාරයකු හෝ සිහිවිකල වූ වකු බවට සහ දැන්වීමෙහි විධිවිධාන සලසා ඇති පරිදි ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය පවරනු ලැබූ කිසිම නියෝජිතයකු නැති බවට සෑහීමට පත්වූයේ නම්, ඒ නිලධාරියා විසින් ම නැතහොත් ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් අනුව ඒ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසු සහ නිසි තැනැත්තකු වෙත බලය පැවරිය හැකි ය.” [1954 අංක 39, § 4]

ඉඩමක සන්තකය භාර ගැනීම හෝ ඉඩමක් පරවශතාවකට යටත් කිරීම සඳහා වූ නියමය.

“**38**. 17 වන වගන්තිය යටතේ තීරණයක් කිරීමෙන් පසු යම් අවස්ථාවක අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියමයකින්-

(අ) ඒ තීරණය යම් ඉඩමක් අත්කර ගැනීමට අදාළ වන විට, ඒ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයෙහි අත්කර ගැනීමේ නිලධාරියාට හෝ අත්කර ගැනීමේ නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකුට ආණ්ඩුව වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය භාර ගන්නා ලෙස නියම කළ හැකි ය; නැතහොත්

(ආ) ඒ තීරණය යම් පරවශතාවක් අත්කර ගැනීමට අදාළ වන විට, ඒ පරවශතාව අත්කර ගැනීමට නියමිත ව ඇත්තේ යම් ඉඩමකින් ද ඒ ඉඩම ඒ පරවශතාවට යටත් විය යුතු ය යි ප්‍රකාශ කළ හැකි ය;

එසේ වුව ද-

(අ) 2 වන වගන්තිය යටතේ දැන්වීමක් ඒ ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ පළමු වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක හෝ 4 වන වගන්තිය යටතේ දැන්වීමක් ඒ ඉඩමෙහි හෝ එය අසළ පළමු වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක යම් අවශ්‍යතාවක් හේතු කොට ගෙන යම් ඉඩමක සන්තකය වහා ම භාර ගැනීම අවශ්‍ය වන විට, සහ

(ආ) ඒ පරවශතාව අත්කර ගැනීමට නියමිත ව ඇත්තේ යම් ඉඩමකින් ද ඒ ඉඩමෙහි හෝ එය අසළ 4 වන වගන්තිය යටතේ දැන්වීමක් පළමු වරට

ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක යම් අවශ්‍යතාවක් හේතු කොට ගෙන යම් පරවශතාවක් වහා ම අත්කර ගැනීමට අවශ්‍ය වන විට

මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ අමාත්‍ය වරයා විසින් නියමයක් කළ හැකි ය.''

**සටහන් අංක 07 - 454 වන අධිකාරය වූ රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය.**

"6. (1) කිසියම් පුණ්‍යාමය, අධ්‍යාපනික, පරිත්‍යාගමය, ආගමික හෝ විද්‍යාත්මක කර්තව්‍යයක් හෝ ජනාධිපතිවරයා විසින් අනුමත කළ හැකි සෙසු කවර කටයුත්තකට ඉතා සුළු මුදලක් කුලියක් හෝ පාරිතෝෂයක් අය කොට විශේෂ ප්‍රදානයක් හෝ විශේෂ බද්දක් වශයෙන් රජය සතු ඉඩම් පිරිනැමීම කළ හැකි ය. විශේෂ ප්‍රදාන හා බදු.

(2) එබඳු සෑම විශේෂ ප්‍රදානයක් හෝ බද්දක්, නියමිත ආකෘතියට සාරානුරූප විය යුතු අතර, එම ඉඩම ප්‍රදානය කළ හෝ බදු දුන් කාර්යයට එම ඉඩම නො යෙදුවහොත් හෝ එම ඉඩම සෙසු කිසියම් වෙන කටයුත්තක් සඳහා යෙදවුවහොත් එහි අයිතිය රජයට ම ආපසු හිමිවන බව පූර්වෝක්ත ආකෘතියේ සඳහන් විය යුතු ය.

(3) කිසියම් විශේෂ ප්‍රදානයක හෝ බද්දක විස්තර කර ඇති ඉඩමක්, එම ප්‍රදානය හෝ බද්ද දෙන ලද කටයුත්ත සඳහා යෙදවීම නැවතී ඇති බව හෝ එය සෙසු කිසියම් කටයුත්තක් සඳහා යෙදුනු බව හෝ කිසියම් කොන්දේසියකට අනුකූලතාව දක්වන්නට හෝ ප්‍රදානයේ නැතහොත් බද්දේ කිසියම් ප්‍රතිඥාවක් ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව ඔප්පු වූ කල් හි, සුදුසු අධිකරණ බලය ඇති අධිකරණයකට ඉදිරිපත් කොට පූර්වෝක්ත ප්‍රදානය හෝ බද්ද අවලංගු කෙරෙන්නා වූ ද, සියලුම බැඳීම්වලින් තොරව එම ඉඩම රජයට පැවරෙන බව ප්‍රකාශ කෙරෙන්නා වූ ද නඩු තීන්දුවක් ලබා ගැනීමට රජයට බලය ඇත්තේ ය. එසේ ම එම විශේෂ ප්‍රදානයේ හෝ බද්දේ දිනයෙන් පසු එම ඉඩමෙහි කර ඇති කිසියම් වැඩි දියුණුවක් වෙනුවෙන් වන්දි වශයෙන් කිසිම තැනැත්තකුට කිසිම මුදලක් ගෙවීමට රජය යටත් නො විය යුතු ය.''

**සටහන් අංක 08 - 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තිය.**

"**291**. (1) තත් කාලයෙහි බල පවත්නා යම් නීතියක අධිකාරය යටතේ යම් දඩයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දඩය සම්බන්ධයෙන් යම් ප්‍රකාශිත විධිවිධානයක් ඒ නීතියෙහි ඇතුළත් ව නොමැති විට, පහත දැක්වෙන විධිවිධාන ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. එනම්-

දඩ ගැසීමේ දණ්ඩන නියමයන්ට අදාළ විධිවිධාන.

(අ) දඩය යම් මුදලක් දක්වා වැඩි කළ හැකි යයි ප්‍රකාශිතව ම සඳහන් කර නොමැති අවස්ථාවක, වරදකරු විසින් ගෙවීමට යටත් වන්නා වූ මුදල සීමා රහිත වන නමුත් එය ඉතා අධික නොවිය යුතු ය;

(ආ) බන්ධනාගාරගත කිරීමක් සහිතව හෝ රහිතව හෝ වරදකරුට දඩ ගැසීමේ දණ්ඩන නියමයක් කරනු ලැබුවා වූ ද බන්ධනාගාරගත කිරීමකින් මෙන් ම දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි වූ ද වරදක් සම්බන්ධයෙන් වූ සෑම අවස්ථාවක දී ම සහ වරදකරුට දඩ ගැසීමේ දණ්ඩන නියමයක් කරනු ලැබුවා වූ ද දඩයකින් පමණක් දඬුවම් කරනු ලැබිය හැකි වූ ද වරදක් සම්බන්ධයෙන් වූ සෑම අවස්ථාවක දී ම, වරදකරු විසින් ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට, ඔහු එක්තරා කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු යයි, දණ්ඩන නියමය කළ අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි, ඒ දණ්ඩන නියමයෙන් විධාන කළ හැකි ය. ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය ඔහුට නියම කරනු ලැබිය හැකි ව තිබුණු වෙනත් යම් බන්ධනාගාරගත කිරීමේ කාලයට ඔහුට නියම කරනු ලැබිය හැකිව තිබුණු වෙනත් යම් බන්ධනාගාරගත කිරීමේ කාලයට නැතහොත් දණ්ඩන නියමයක් න්‍යාදේශ කිරීම යටතේ ඔහු යටත් විය හැකි බන්ධනාගාරගත කිරීමේ කාලයට අමතරව විය යුතු ය;

(ඇ) වරදකරුට නියම කරන ලද දඩය රුපියල් දහසක් නොඉක්මවන අවස්ථාවක, ඒ දඩය ගෙවනු ලැබීම පැහැර හරිනු ලැබූ විට, (ආ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුන ද,

පහසු පරිශීලනය සඳහා පමණි - නීතිමය ලේඛනයක් නොවේ

බන්ධනාගාරගත කිරීමක් අධිකරණය විසින් නියම කරනු නොලැබිය යුතු නමුත් 15 (2) වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය;

(ඇ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට වරදකරු බන්ධනාගාරගත කරන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලබන්නේ යම් කාලයකට ද ඒ කාලය, වරද බන්ධනාගාරගත කිරීමකින් මෙන් ම දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි වරදක් වේ නම්, ඒ වරද සඳහා නියමිත උපරිම බන්ධනාගාර ගත කිරීමේ කාලයෙන් හතරෙන් එකක් නොඉක්මවන කාලයක් විය යුතු ය;

(ඉ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට අධිකරණය විසින් නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීම, ඒ වරද සම්බන්ධයෙන් ඒ වරදකරුට නියම කරනු ලැබිය හැකිව තිබුණු කවර හෝ විස්තරයකට අයත් බන්ධනාගාරගත කිරීමක් විය හැකි ය; වරද දඩයකින් පමණක් දඬුවම් කරනු ලැබිය හැකි වරදක් නම්, ඒ බන්ධනාගාරගත කිරීම බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමක් විය යුතු ය;

(ඊ) වරද බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය නොහැකි වරදක් නම්, දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට වරදකරු බන්ධානගාරගත කරන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලබන්නේ යම් කාලයකට ද, ඒ කාලය පහත දැක්වෙන සීමාවන් නොඉක්මවිය යුතු ය;

එනම්:-

(i) දඩ මුදල රුපියල් විසිපහක් ඉක්මවන නමුත් රුපියල් නොඉක්මවන අවස්ථාවක, දින හතක කාලයක්;

(ii) දඩ මුදල රුපියල් විසිපහක් ඉක්මවන නමුත් රුපියල් පනහක් නොඉක්මවන අවස්ථාවක, දින

දහහතරක් නොඉක්මවන යම් කාලයක්;

(iii) දඩ මුදල රුපියල් පනහක් ඉක්මවන නමුත් රුපියල් එක් සියයක් නොඉක්මවන අවස්ථාවක, මාස තුනක් නොඉක්මවන යම් කාලයක්;

(iv) දඩ මුදල රුපියල් සියයක් ඉක්මවන අවස්ථාවක මාස හයක් නොඉක්මවන කාලයක්;

(උ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීම, ඒ දඩය ගෙවනු ලැබූ හෝ නීති මාර්ගයෙන් එය අය කර ගනු ලැබූ කවර හෝ විටක අවසන් විය යුතු ය;

(ඌ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ කාලය ඉකුත් වීමට පෙර, ඒ දඩයෙන් යම් කොටසක් ගෙවනු ලැබුවහොත් හෝ අය කර ගනු ලැබුවහොත් හෝ අය කර ගනු ලැබුවහොත් සහ ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ දක්වා බන්ධනාගාරගතව සිටි කාලය එවකටත් ගෙවිය යුතු ව ඇති දඩ මුදලේ කොටසකට වඩා සමානුපාතිකව අඩ නොවේ නම්, බන්ධනා ගාරගත කිරීම අවසන් විය යුතු ය;

(එ) නොගෙගවා ඇති දඩය හෝ එහි කොටස දණ්ඩන නියමය කරනු ලැබීමෙන් පසු අවුරුදු හයක් ඇතුළත කවර හෝ වේලාවක දී වුව ද, දණ්ඩන නියමය යටතේ අවුරුදු හයකට වඩා දීර්ඝ කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට වරදකරු යටත් වන්නේ නම්, ඒ කාලය ඉකුත් වීමට පෙර කවර හෝ වේලාවක දී වුව ද අය කර ගනු ලැබිය හැකි අතර වරදකරුගේ ණය සඳහා ඔහුගේ මරණයෙන් නීත්‍යානුකූලව යටත් වන යම් දේපළක්, ඔහුගේ මරණය නිසා එම යටත් වීමෙන් නිදහස් නොවේ.

(2) තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක අධිකාරය යටතේ දඩයක් ගෙවන ලෙස වරදකරුට දණ්ඩන නියමයක් කර ඇති කවර හෝ විටක, දණ්ඩන නියමය කළ අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, වරදකරුට අයත් යම් චංචල

දේපළක් විනිග්‍රහණය කොට, එය විකිණීමෙන් ඒ මුදල අයකර ගැනීම සඳහා බලපත්‍රයක්, ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් වරදකරු බන්ධනාගාරගත කරනු ලැබිය යුතු බවට දණ්ඩන නියමයෙන් විධාන කරනු ලැබ තිබුණත්, නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ බලපත්‍රය අධිකරණයේ පිස්කල්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, එය ශ්‍රී ලංකාවේ කවර හෝ ස්ථානයක දී ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය. එහෙත් ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් අධිකරණයක් විසින් ද ඒ අධිකරණයේ බල සීමාවෙන් පිටත දී එය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය වුවහොත්, එසේ ක්‍රියාවේ යෙදවිය යුතු ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයකු විසින් එය පිටසන් කරනු ලැබිය යුතු ය.

(3) වරදකරුවකුගේ සහ ඔහුගේ පවුලේ අයගේ ඇඳුම් පැළඳුම් ද රුපියල් දෙසිය පනහක් දක්වා වටිනාකමින් යුත් බීජ ධාන්‍ය ද ඇතුළුව ඔහුගේ වෘත්තීය මෙවලම් හා උපකරණ ද විනිග්‍රහණ බලපත්‍රයක් යටතේ ගැනීම නොකළ යුතු ය.

(4) දඩයක් ගෙවීම සඳහා පමණක් ද දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට බන්ධනාගාරගත කිරීම සඳහා ද වරදකරුවකුට දණ්ඩන නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, පහත දැක්වෙන සියලු දේ හෝ ඉන් කොටසක් හෝ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය:-

(අ) එකී දඩය ගෙවීම සඳහා කල් දීම;

(ආ) එකී දඩය වාරික මගින් ගෙවීමට විධාන කිරීම;

(ඇ) එකී දඩය හෝ එහි යම් වාරිකයක් ගෙවීම සඳහා ඇපකරුවකු හෝ ඇපකරුවන් හෝ ඇතිව හෝ නැතිව අධිකරණය සෑහීමට පත්වන අන්දමේ බැඳුම්කරයකට ඇතුළුවීමට එකී දඩය ගෙවීමට යටත් වන තැනැත්තාට නිදහස ඇති බව විධාන කිරීම, තව ද මේ සංග්‍රහයෙන් විදිවිධාන සලසා ඇති ආකාරයෙන් ඒ බැඳුම්කරයට ඇතුළුවීම හා ඒ බැඳුම්කරය ක්‍රියාත්මක කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) යම් දඩයක් වාරික මගින් ගෙවීම විධාන කර ඇති හා යම් එක් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති විටක, එතෙක් නොගෙවා ඇති සියලු වාරික ගෙවීම පැහැර හරිනු ලැබූ විටක කාර්ය පිටිපාටිය ම අනුගමනය කරනු ලැබිය හැකි ය.

**සටහන් අංක 09 - 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 321, 322 (1), 322 (2), 325, 326, 328 (ඈ), 329 සහ 330 වන වගන්ති.**

කාලය ගණන් බැලීම.

"**321**. (1) අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ගණන් බැලීමේ දී, අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව ද ඒ නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ දිනය ගණන් ගත යුතු නමුත් සියලුම ඉරු දින සහ රජයේ නිවාඩු දින ගණන් ගනු නොලැබිය යුතු ය.

(2) අභියාචන පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය ඉකුත් වන දිනය අධිකරණයේ කාර්යාලයය වසා ඇති දිනයක් වුවහොත්, ඉන් පසු ඒ කාර්යාලයය විවෘත කෙරෙන ඊළඟ ප්‍රථම දිනයෙහි එය ඉදිරිපත් කරනු ලැබී නම් එය නිසි කල්හි ඉදිරිපත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අභියාචන පෙත්සමෙහි ප්‍රකාශ විය යුතු කරුණු.

"**322**. (1) සෑම අභියාචන පෙත්සමක ම අභියාචනයට පදනම් වූ කරුණු ලුහුඬින් ප්‍රකාශ විය යුතු අතර අභියාචක විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ එය අත්සන් කර තිබිය යුතු ය.

(2) අභියාචනය කරනුයේ නීතිය පිළිබඳ කාරණයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, විවාදයට භාජන කළ යුතු එම නීතිය පිළිබඳ කාරණය සම්බන්ධයෙන් වූ ප්‍රකාශයක් පෙත්සමෙහි ඇතුළත් විය යුතු අතර එම නීතිය පිළිබඳ කාරණය අභියාචනාධිකරණය විසින් විනිශ්චය කරනු ලැබීමට සුදුසු ප්‍රශ්නයක් බවට නීතිඥවරයකුගේ සහතිකයක් ද එහි ඇතුළත් විය යුතු ය.

(3) ඒ සෑම පෙත්සමක ම රුපියල් පහක මුද්දරයක් අලවා තිබිය යුතු ය;

එසේ වුව ද, -

(අ) අභියාචනය 320 (2) වන වගන්තිය යටතේ නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබ තිබේ නම්, හෝ

(ආ) 136 (1) (ආ) වන වගන්තිය යටතේ කරන ලද ලිඛිත වාර්තාවක් මත පවරන ලද යම් නඩු කටයුත්තක දී මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුවකට හෝ අවසාන ආඥානකට හෝ විරුද්ධව කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් වන විට, ඒ වාර්තාව කළ තැනැත්තා විසින් ඒ අභියාචනය ඉදිරිපත් කරනු ලැබේ නම්,

ඒ මුද්දරය අවශ්‍ය නොවිය යුතු ය:

එසේ ම තවදුරටත්, අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණයට සුදුසු යයි පෙනී යයි නම් අභියාචනයේ නඩු තීන්දුව දෙනු ලබන තුරු මුද්දර ගාස්තුව ගෙවීම නතර කර තැබිය හැකි ය.

(4) අභියාචනයේ තීරණය පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ අභියාචකගේ වාසියට දෙනු ලැබුවහොත්, මුද්දර ගාස්තුවක් ගෙවා ඇති විට එය ඔහුට ආපසු දිය යුතු ය.

(5) අභියාචනයේ තීරණය අභියාචකට විරුද්ධව දෙනු ලැබුවහොත්, මුද්දර ගාස්තුව ඔහු විසින් ගෙවා නැති විට, ඒ මුද්දර ගාස්තුව සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ අඩු කිරීම යෝග්‍ය යයි අභියාචනාධිකරණය විසින් සලකනු ලබන්නේ නම් මිස, එය ඔහු විසින් ගෙවිය යුතු ය: නැතහොත් දඩයක් අයකර ගන්නා ආකාරයට ඔහුගෙන් අයකර ගත යුතු ය. අඩුකිරීමක් සිදු වුව හොත් එවිට එසේ අඩු කරනු නොලැබූ කොටස පමණක් අය කර ගනු ලැබිය යුතු ය.

පළමුව අභියාචකට සවන් දිය යුතු බව.

"**325**. (1) අභියාචනය විභාගය සඳහා ගනු ලැබූ විට, අභියාචක පැමිණ සිටී නම්, අභියාචනය සනාථ කිරීම සඳහා ඔහු ඉදිරිපත් කරන කරුණුවලට පළමුව සවන් දිය යුතු අතර, වගඋත්තරකරු පැමිණ සිටී නම්, අභියාචනයට විරුද්ධව ඔහු ඉදිරිපත් කරන කරුණුවලට ඉන් අනතුරුව සවන් දිය යුතු ය.

(2) අභියාචනය සනාථ කිරීම සඳහා අභියාචක පැමිණ නොසිටී නම්, අධිකරණය විසින් අභියාචනය සලකා බලා සුදුසු යයි අධිකරණය සලකන යම් ආඥාවක් ඒ සම්බන්ධයෙන් කළ හැකි ය.

වගඋත්තරකරු පැමිණ නොසිටින විට, කාර්ය පටිපාටිය.

"**326**. අභියාචනයක් විභාග කරන විට වගඋත්තරකරු අධිකරණයට පැමිණ නොසිටී නම් සහ අභියාචන දැන්වීම ඔහුට යථා පරිදි භාර දී ඇති බවට අධිකරණය සෑහීමට පත් නොවී නම්, පෙනී සිටීමට ඔහුට ඉඩ සැලැස්වීම සඳහා අධිකරණය විසින් අභියාචන විභාගය මතු දිනයකට අඩාළව කල් තබනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී ඔහුට භාර දීමට නියමිත දැන්වීම පිස්කල් මගින් භාර දීම සඳහා අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. එහෙත් ඉහත කී පරිදි අධිකරණය සෑහීමට පත් වුවහොත් මිස වගඋත්තරකරු පැමිණ නොමැති විට ඔහුට හානිකර ආඥාවක් අධිකරණය විසින් නොකළ යුතු ය.

"**328**. අභියාචනය විභාග කිරීමේ දී, මැදිහත් වීමට තරම් ප්‍රමාණවත් හේතු නොමැති බව අධිකරණය සලකන්නේ නම් අභියාචනය නිෂ්ප්‍රභ කළ හැකි ය; නැතහොත්, - අභියාචන සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ බලය.

(අ) නිදොස් කිරීමේ ආඥාවකට විරුද්ධව වූ අභියාචනයක දී, ඒ ආඥාව ප්‍රතිවර්තනය කොට අවස්ථාවෝචිත පරිදි, වැඩිදුර විභාග පවත්වන ලෙස හෝ චූදිතයා නැවත නඩු විභාගයට භාජන කරන ලෙස හෝ ඔහුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබන ලෙස හෝ විධාන කිරීම නැතහොත් ඔහු වරදකරු බව තීරණය කොට ඔහු විෂයෙහි නීතිය අනුව දණ්ඩන නියමයක් කිරීම;

(ආ) වරදකරු කිරීමකට විරුද්ධව වූ අභියාචනයක දී -

(i) තීන්දු ප්‍රකාශය හා දණ්ඩන නියමය ප්‍රතිවර්තනය කොට චූදිතයා නිදොස් කිරීම හෝ නිදහස් කිරීම හෝ නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඔහුට විරුද්ධව නැවත නඩු විභාග කරනු ලැබිය යුතු යයි නැතහොත් ඔහුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තැබිය යුතු යයි ආඥා කිරීම; හෝ

(ii) දණ්ඩන නියමය එසේම තිබිය දී තීන්දුව වෙනස් කිරීම හෝ තීන්දුව වෙනස් කර හෝ නොකර දණ්ඩන නියමයේ ප්‍රමාණය වැඩි හෝ අඩු කිරීම හෝ එහි ස්වභාවය වෙනස් කිරීම;

(ඇ) වෙනත් යම් ආඥාවකට විරුද්ධව වූ අභියාචනයක දී, ඒ ආඥාව වෙනස් කිරීම, ප්‍රතිවර්තනය කිරීම,

කළ හැකි ය:

එසේ වුව ද, අභියාචනයක් මත කරනු ලබන දණ්ඩන නියමය මුල් අධිකරණය විසින් නියම කළ හැකිව තිබූ දණ්ඩන නියමය නොඉක්මවිය යුතු ය.

"**329**. (1) මේ පරිච්ඡේදය යටතේ අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේ දී වැඩිදුර සාක්ෂි අවශ්‍ය යයි අභියාචනාධිකරණය කල්පනා කරන්නේ නම් ඒ වැඩිදුර සාක්ෂි අභියාචනාධිකරණය විසින් ම සටහන් කළ හැකි ය. අභියාචනාධිකරණය විසින් වැඩිදුර සාක්ෂි සටහන් කළ හැකි බව හෝ සාක්ෂි සටහන් කරන ලෙස විධාන කළ හැකි බව.

නැතහොත් ඒ සාක්ෂි සටහන් කරන ලෙස මහේස්ත්‍රාත්වරයකුට විධාන කළ හැකි ය.

(2) වැඩිදුර සාක්ෂි සටහන් කරනු ලැබූ විට, ඒ සාක්ෂි සටහන් කළ මහේස්ත්‍රාත්වරයා විසින් එසේ සටහන් කරන ලද සාක්ෂි යථා පරිදි සහතික කොට, ඒ සාක්ෂි පිළිබඳව තම මතය ද දක්වා, ඒ සාක්ෂි අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

(3) අභියාචනාධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරතහොත් මිස, මෙම වගන්තිය හා 328 වන වගන්තිය යටතේ වැඩිදුර සාක්ෂි කිසිවක් සටහන් කරන විට චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ පැමිණ සිටිය යුතු ය.

(4) ඒ සාක්ෂි සටහන් කර ගැනීම, XV වන පරිච්ඡේදය යටතේ වූ පරීක්ෂණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

"**330**. (1) අභියාචන විභාගය අවසන් වූ විට, අභියාචනාධිකරණය විසින් ඒ අවස්ථාවේ දී ම හෝ තත් කාර්යය සඳහා ඒ අවස්ථාවේ දී නියම කළ යුතු යම් පසු දිනයක හෝ, තම තීරණයට හේතු දක්වමින්, නඩු තීන්දුව විවෘත අධිකරණයේ දී ප්‍රකාශ කළ යුතු ය.

අභියාචනයේ නඩු තීන්දුව විවෘත අධිකරණයේ දී ප්‍රකාශ කළ යුතු බව.

(2) එසේ නියම කරන ලද දිනයේ දී, නඩු තීන්දුව දීමට අධිකරණය සූදානම් නැත්නම්, ඒ කාර්යය සඳහා තවත් පසු දිනයක් නියම කොට ප්‍රකාශයට පත් කළ හැකි ය.